# භක්ති ප්‍රබෝධනය

එකසිය විසිපස්වසරක් ඉක්මවූ නොනවතින යුග මෙහෙවර

2025 සැප්තැම්බර් - ඔක්තෝබර් 126 වන කාණ්ඩය - 05 කලාපය පිටු 32 DOP/NEWS/02/2025

# අපේ ජ්‍යෙෂ්ඨයෝ



ශ්‍රී ලංකාවේ පළ වන ඉපැරණි ම සිංහල සඟරාව

ආරම්භය 1899

# වියපත් බව මගෙ දොරකඩ ළඟ

ගී පද - බන්දුල නානායක්කාරවසම්
තනු නිර්මාණය - ආචාර්ය රෝහණ වීරසිංහ
ගායනය - ආචාර්ය රෝහණ වීරසිංහ



වියපත් බව මගෙ දොරකඩ ළඟ
කුටියට එන්නට ඉල්ලනව ද
තව අවසන් නැහැ කළ යුතු වැඩ
මට ඉඩ දී මග හැර යනව ද

සතුටුයි ආ මග දෙස බැලූ විට
මිහිරි යි කළ කී දේ දුටු විට
හිත මුමුණයි තව කළ යුතු වග
වියපත් බව ඇයි මේ හදිසිය
දන්නෙමි මේ ජීවිතයේ ඉම
යා යුතු වේ ගමන ද කර නිම
එනමුත් මෙය නොම වේ නිසි කල
මා පවසන්නේ වියපත් මට

බිරිඳට දරු මුනුපුරු කැලකට
දුන්නත් සෙනෙහස නෑ එය නිම
ඉර හඳ තරු සහසක් දැක දැක
මතකය මිතුරෙකු වී තනියට
අප ආවේ කොහි සිට මෙලොවට
යළි යන්නේ මෙතනින් කොයිබට
නොදනිමු අප දන්නේ හැම විට
ජීවත් වන බව මේ මොහොතට

ළමා විය, යොවුන් විය, මැදි විය පහුකර විත් මගේ ජීවිතයත් මහලු විය ට එළඹිලා. මෙතැන් සිට විය හැක්කේ කුමක් ද? "දැන් මං වයස යි" කියා නිතර ම දැනෙන්න ගනීවි. අතපයේ හයිය හත්තිය අඩු වේවි. ඇස් පෙනීම, කන් ඇහීම දුර්වල වේවි. හම රැලි වැටේවි. මෙතක් කල් මහමෙර සේ අකම්පිතව සිටි මගේ හිතට, මොකක් දෝ අමුතු අවිනිශ්චිත බවක් දැනෙන්න ගත්තා. **වියපත් බව, ඔබ මාව මෙලෙස බය කරන්නේ ඇයි?**

ඔව්... මම තව ම සූදානම් නැහැ, ජීවන ගමනේ යථාර්ථය පිළිගන්න. කෙසේ හෝ නිම කළ යුතු යැයි සිතා මට ම වද දෙමින්, වැඩ රාජකාරි කන්දක් මං හිත මත්තේ ගොඩ ගහගෙන. අත්හැරිය යුතු වුවත්, අත්හරින්නේ කොහොම ද? **ඒ නිසා වියපත් බව, කරුණාකර මට ඉඩ දී මා මග හැර යන්න.**

ජීවිතේ මෙතෙක් ආ ගමන් මග ගැන මට තිබෙන්නේ අප්‍රමාණ සතුටක්. බලාපොරොත්තු වුණු ගොඩාක් සිහින, අරමුණු සහ ඉලක්කවලට යන්න හැකියාව නො ලැබුණා නෙමෙයි. ඉගෙන ගත්තා, රස්සාවක් කළා, විවාහ වුණා, ගෙවල් ගත්තා, ළමයි හැදුවා, එයාලව බන්දලා දුන්නා, මුනුපුරන් බැලුවා... දැන් ඉතිං ඇති, මහන්සියි, තව බැහැ කියා හිතෙනවා. එහෙත්... "මෙය නෙමෙයි ඊට මොහොත!" හද පතුලින් නැගේ හඬක්. **ඒ නිසා වියපත් බව, කරුණාකර මට ඉඩ දී මා මග හැර යන්න.**

අතීතයෙන් වර්තමානයට. වර්තමානයෙන් අනාගතයට. කවදා හෝ මේ ගමන මරණින් කෙළවර විය යුතු යි. මරණින් මතු මගේ ජීවිතය කෙසේ වේවි ද? එක අතකට... නොදන්නා අනාගතය ගැන ළතැවිල්ලෙන් විපිළිසරව ඉන්නවාට වඩා, මේ මොහොත උපරිමයෙන් ජීවත් වීම නේ ද, සැබෑ ප්‍රීතියේ උපත? පහන් සිතින් හැම දේ දෙස ම උපේක්ෂාවෙන් බැලීම නේ ද, සැබෑ සැනසුමේ රහස? ශරීර අවයව කෙමෙන් වියැකී ගියත්, නොමියෙන එක ම දායාදය නේ ද, ප්‍රේමය?

**එබැවින් වියපත් බව, කාලය හරි නම් එන්න. පැමිණ මා හා රැඳෙන්න. ඔබ සමඟ, ඔබ තුළ ම, ජීවිතය මම විඳින්නම්.**

**ගරු ශානිල් දිනුක ජයවර්ධන නි. ම. නි. පියතුමා**

# භක්ති ප්‍රබෝධනය

**2025 සැප්තැම්බර් - ඔක්තෝබර්**


ප්‍රකාශනය

නිර්මල මරිය නිකාය

භාරකරු

අතිගරු රොෂාන් සිල්වා නි. ම. නි. පියතුමා
නිර්මල මරිය නිකායික ප්‍රාදේශාධිපති
කොළඹ ප්‍රාදේශිකය

සංස්කාරක

ගරු එමාඩ් දල්පතාදු නි. ම. නි. පියතුමා

සංස්කරණ සහාය

රූපස් ප්‍රැන්සිස්
ටී. සුනිල් ප්‍රනාන්දු
ලහිරු දරණකුඹුර

කවරය නිර්මාණය

අචල රූපසිංහ

පරිගණක පිටු සැකසුම

නිලුමිණ හර්ෂාන්

මුද්‍රණය

එස් ඇන්ඩ් එස් ප්‍රින්ටර්ස් මුද්‍රණාලය
කොළඹ 10.


## පිටුවෙන් පිටුව..........


2 කවරයේ කථාව

3 හෙළිදරව්ව

5 වැඩිහිටි අපේ ජ්‍යෙෂ්ඨයෝ - කාමන් සකුන්තලා

6 වෙමු ද අපේ ජ්‍යෙෂ්ඨයන් ... - බුද්ධික සඳරුවන්

7 ජ්‍යෙෂ්ඨයින් දැකගන්නට - පස්කල් ජයමාන්න

8 වැඩිහිටි විය - ප්‍රියංගනී කුමාරගම

10 ජ්‍යෙෂ්ඨ - කනිෂ්ඨ ... - තීක්ෂණ පෙරේරා

11 අඩ සියවසක රන් ... - ශ්‍යාමලී අනුරුද්ධිකා

12 අපෙන් ගිලිහුණු දහම් පන්හිඳ - රූපස් ප්‍රැන්සිස්

13 රුස්ස ගස් වැනි ... - කීර්ති සඳරුවන් ප්‍රනාන්දු
අපේ ජ්‍යෙෂ්ඨයෝ - අයිරින් කොස්තා

14 සියලු සත්ත්වයෝ නිදුක් වෙත්වා ! ...
ෂෙලින්ඩා සමරසිංහ

16 සම්භවය - ඩබ්. ඩී. මැටිල්ඩා අධිකාරම්

17 කෙටි කතාව - ඇග්නස් චන්ද්‍රකාන්ති ජයමාන්න

19 වි. ලෙ. පීරිස් ... - ඩබ්. ඩී. මැටිල්ඩා අධිකාරම්

20 ජේසු නිකායේ ... - මලින්ත බෝපෙආරච්චි

21 හැරී බලනට පෙර එබී බලමු - රවිඳු ප්‍රශාන්ත
හෙට කතා කරමු - CJED
ඔබ ම ය සමිඳුනි ආධාරේ - හැරී ලැම්බට් වාස්

22 **Is Aging Elders' Mistake ?** - K. C. Grero

23 තවත් යන්නට දුර තියේවි ද? - ශාන්ත රණතුංග

24 ඕං එහෙනං - සූරිය මාමා

25 කාව සිත - චමත් බී. පයාගල
අමිතගේ හද ගැස්ම - සී. අමිත

26 පුංචි විකුම් - තරු නැන්දා

27 ප්‍රහේලිකා අංක - 87
ගරු චාමික සුදර්ශන නි.ම.නි. පියතුමා

28 ප්‍රහේලිකා අංක 85 පිළිතුරු

29 අ. පො. ස. (සා. පෙළ) ආදර්ශ ප්‍රශ්න පත්‍රය II
ජේ. ඒ. එල්. ශ්‍රීමති සිල්වා මෙනවිය

31 අ. පො. ස. (උ. පෙළ) ක්‍රිස්තියානි ධර්මය ...
එස්. හේමාල් පෙරේරා

වසර 1899 සිට අඛණ්ඩව එළිදක්වන භක්ති ප්‍රබෝධනය ශ්‍රී ලංකාවේ පළ වන ඉපැරණි ම සිංහල සඟරාව යි. භක්ති ප්‍රබෝධනය නිර්මල මරිය නිකායේ කොළඹ ප්‍රාදේශිකයේ භාරකාරත්වය යටතේ පළ වන ප්‍රකාශනයකි. (නි.ම.නි.)

දුප්පතුන්ට සුබාරංචිය දේශනා කිරීමට
නි. ම. නි.
මා ආලේප කළ සේක

Bhakthi Prabodhanaya, Published continuously since 1899, is the oldest Sinhala magazine in Sri Lanka. Bhakthi Prabodhanaya, is owned and published by the Colombo Province of the Oblates of Mary Immaculate. (O.M.I.)




## කවරයේ කථාව

මහා ඝන වනපෙත් මධ්‍යයේ කුණාටු අබියස ද නොසැලී සිටින දැවැන්ත වෘක්ෂයන් වන් අප ජ්‍යෝෂ්ඨයෝ අපගේ පෙරගමන්කරුවෝ ය. ඔවුන් දලු ලා වැඩී අහවර ය. ඒ නැවුම් බව ඔවුහු දනිති. ඔවුන් වැඩී විකසිත පියුම් දරා පිබිදී පරාග නය වන්නට සැරසී බලා සිටි කාලය අහවර ය. එහි මහිමය ද නීරස බව ද ඔවුහු දනිති. ඔවුන් පලදරා අහවර බැවින් එහි අභිමන් සේ ම අවමන් ද මනා සේ දනිති. ඔවුන් කැඩී බිඳී, නැවත දලු ලා වැඩී අහවර ය. එහි සන්තාපය ද ප්‍රීතිය ද ඔවුහු එක සේ දනිති. මහා වෘක්ෂයෝ, ඔවුන්ගේ කලින් කලට වියැළෙන පත්‍රයන්ගෙන් සමීප පැළෑටි ද පස ද පෝෂණය කරන්නට සැරසී සිටින්නාක් මෙන් අප උගත යුතු සහ අප භාවිත කළ යුතු ඔවුන්ගේ ආනන්දජනක නිර්මාණ අපට තිළිණ කරන්නට ද ඔවුහු සැරසී සිටිති. කෘතවේදී හදින් වැලඳ ගනිමු එය ප්‍රේමයෙන්. නික්ම යන තුරු වාරුවක් වී වැඩෙමු, ඔවුන්ගේ සෙවණේ ස්නේහයෙන්. මතු උදා වන අලුත් හිරු යට අපි දු විහිදුවමු සැබෑ ජ්‍යෝෂ්ඨත්වයේ මහඟු හරයන්.

**අචල රූපසිංහ**

**භක්ති ප්‍රබෝධනය**

දායකත්වය එක් වසරකට - රු. 850.00
(මුද්දර ගාස්තුව ද ඇතුළුව)
දායකත්වය වසර දෙකකට - රු. 1700.00
(මුද්දර ගාස්තුව ද ඇතුළුව)

සියලු ම ලිපි, දායකත්ව මුදල් හා විමසීම් මේ ලිපිනයට යොමු කරන්න.

සංස්කාරක පියතුමා.
"භක්ති ප්‍රබෝධනය"
265, ඩීන්ස් පාර, මරදාන, කොළඹ 10.
දුරකතන : 0112 698 177
විද්‍යුත් තැපෑල :
bhakthi.prabodhanaya@gmail.com
වෙබ් ලිපිනය : bpomi.org

**BHAKTHI PRABODHANAYA**

Rs. 850.00 for a year (Including Postage)
Rs. 1700.00 for two years
(Including Postage)

All articles, subscriptions and inquiries should be sent to this address.

Editor.
"Bhakthi Prabodhanaya"
265, Deans Road, Maradana,
Colombo 10, Sri Lanka
Tel. : 0112 698 177
Email: bhakthi.prabodhanaya@gmail.com
Web Address : bpomi.org

# අපේ ජ්‍යෙෂ්ඨයෝ හෙළිදරව්ව

මනුෂ්‍ය ජීවිතයේ විවිධ අදියර අපට හමු වේ. බිලිඳු, ළදරු, ළමා, නව යෞවනය සහ තාරුණ්‍යය, මැදි විය පසු කර ජ්‍යෙෂ්ඨයන් සහ මහලු වයස හෙවත් ජීවිතයේ සැඳෑ සමය ගත කරන්නන් යනුවෙන් වර්ගීකරණය කර ගත හැකි ය.

ජ්‍යෙෂ්ඨයන් වනාහි පරණ යුගයකට අයත්, වයස්ගත, රහක් නැති, පලක් නැති කණ්ඩායමක් සේ සමහරු සිතති. එසේ දකින්නෝ ඉතා ම පටු අවබෝධයකින් ජීවිතය දෙස බලන්නෝ ය. අද අප භුක්ති විඳින සියලුම පහසුකම්, වෘක්ෂලතාවල අඩංගු ඵල, ගොඩනැඟිලි, නිවාස, ව්‍යුහයන්, මහා මාර්ග, තාක්ෂණික මෙවලම් සහ පහසුකම්, ප්‍රවාහනය, වෛද්‍ය විද්‍යාවේ දියුණුව මේ ආදි සියල්ල අද පවතින තැනට ගෙන ආවෝ අපේ ජ්‍යෙෂ්ඨයෝ ය. වෛද්‍යවරුන්, ඉංජිනේරුවන්, විද්‍යාඥයින්, කම්කරුවන්, ගුරුවරුන්, ආගමික නායකයන්, වඩු කාර්මිකයන්, මේසන්වරුන්, ගායක ගායිකාවන්, නළු නිළියන්, දර්ශනවාදීන්, සමාජ විද්‍යාඥයින්, අධ්‍යාපනඥයින් මේ ආදි විවිධ ක්ෂේත්‍රවල ඒ ඒ අංශයන් ඉදිරියට ගෙනෙන්නට මොනතරම් කැපකිරීම් වැයකිරීම් කරමින් වේදනා විඳින්නට ඇති ද? අනාගතයේ ඔවුන් ජීවත් නොවන නිසා අපට පෙර සිටි පරම්පරාව ගස්වැල් වැවීම අත් හැරීමක් කළා නම් අද අප භුක්ති විඳින බොහෝ ආහාර, පලතුරු, සිසිල ගෙනෙන වෘක්ෂලතා අපට අහිමි ය.

නිවැරදිව කල්පනා කරන ඕනෑ ම කෙනකු වටහාගත යුතු සත්‍යය මෙය ය. ජ්‍යෙෂ්ඨයෝ ජීවමාන, ආත්මීය, ආලෝකය බෙදා හරින මනුෂ්‍යත්වයේ යථාර්ථය සහ ගෞරවයට මෙන් ම ආදරයට පාත්‍ර විය යුතු සම්ප්‍රදායේ ආරක්ෂක මුනිවරු ය. මේ අය තම ජීවිතය උරුම කර ගත් සදාචාර, ආගමික විශ්වාස, යහපත් ගුණ ධර්ම සහ ගති පැවතුම් තුළ ගොඩ නැඟුණු නිහතමානී ජීවිත රටාවන්ට හුරු වූ වගකීම මත පදනම් කර ගෙන ජීවත් වූ පරම්පරාවකි. ඔවුහු අපට වඩා ජීවිත පොතේ පිටු ගණනාවක් ඉදිරියෙන් සිටිති. ජ්‍යෙෂ්ඨ පරම්පරාවේ වටිනාකම අමිල වන්නේ ඔවුන්ගෙන් අපට ලැබෙන ජීවිත පාඩම් නිසා ය. ඔවුන් විවිධ අභියෝගවලට මුහුණ දුන්, සොම්නස දොම්නස, යහපත අයහපත, නැති බැරිකම්, අඟ හිඟකම් අතර දෝලනය වූ පරම්පරාවකි. යුද්ධ, ආර්ථික දුෂ්කරතා, සීමිත සන්නිවේදන පහසුකම්, නවීන තාක්ෂණය නොමැතිව සහ ජීවිතයේ අවම සැප පහසුකම් තුළ කැප වී ක්ෂය වූ පරම්පරාවකි. මේ අය ශක්තිමත්, විනීත, අන්‍යෝන්‍ය ආදරය සහ ගරුත්වයෙන් පිරුණු, මුදලට වඩා වටිනාකම් හරහා ගොඩ නැඟුණු පරම්පරාවකි. ඔවුන් අපට උගන්වන්නේ සරල ජීවිතය තුළ සතුට තෘප්තිය සෙවීමේ හැකියාව සහ අන් අය සඳහා ජීවත්වීමේ අවශ්‍යතාව මෙන් ම වගකීමක් සහිතව කටයුතු කරන ආකාරය යි. ඉවසීමෙන් සංවරව හැසිරෙන ආකාරය යි. ආගමික වශයෙන් කල්පනා කරන විට ඔවුන් තම ආගම දහමට දැක් වූ ලැදියාව, ගෞරවය, ඇදහිල්ල, ආගමික පණිවුඩය බාර ගත් ආකාරය සිල්වත් ය; දැහැමි ය. බෞද්ධ සම්ප්‍රදායයට අනුව මව්පියන්ට බුදුන් වහන්සේට සමානව ගෞරව, ආදරය කළ යුතු අයුරු උගන්ව යි. එනම් "ගෙදර බුදුන් 'අම්මා'" යන්න යි.

කිතුනු දහම ද මව්පියන්ට, වැඩිහිටියන්ට කළ යුතු යුතුකම් හා සත්කාර කිරීම පිළිබඳව උගන්ව යි. දස පනතේ හතරවන පනත මඟින් එය සනාථ වේ. ශුද්ධ බයිබලය පවසන්නේ තම මව්පියන්ට කරන ගෞරවය නිසා කෙනෙකුට දේව ආශීර්වාදය ලැබෙන බව යි.

"දෙවි සමිඳාණන් වහන්සේ නුඹට අණ කළ පරිදි නුඹේ පියාට ද මවට ද ගෞරව කරන්න. එවිට දෙවි සමිඳාණන් වහන්සේ නුඹට දෙන දේශයෙහි නුඹ චිරාත් කාලයක් ජීවත් වන්නෙහි ය. නුඹට සෙත සැලසෙනු ඇත" (ද්විතීය නීති සංග්‍රහය 5:16).

"තම පියාට ගෞරව කරන්නා තම පාපවලට වන්දි ගෙවන්නේ ය. තම මවට ගෞරව කරන්නා නිධානයක් රැස් කරන්නෙකු වැනි ය" (උපදේශකයා 3:3-4).

**වයස්ගත වීම නිසා මිනිසුන් තුළ ඇතිවන ලක්ෂණ**

- හම රැළි වැටීම.
- හිසකෙස් සුදු වීම.
- දත් ගැලවී යාම.
- කන් ඇසීම දුර්වල වීම.
- ඇස් පෙනීමේ දුර්වලතා සහ ඇසේ සුද මතු වීම.
- මොළයේ නියුරෝනවල ක්‍රියාකාරීත්වය අඩු වී යාම. (වයසට යන විට වැඩිහිටියන් කුඩා දරුවන් මෙන් හැසිරෙන්නට පටන් ගන්නේ ඒ නිසා ය)
- ආහාර ජීර්ණය අඩු වීම.
- සන්ධිවල දෝෂ ඇති වීම සහ අස්ථිවල කාටිලේජ ක්ෂය වීම.
- කුදු වීම; කොඳු ඇට පෙළේ ආබාධ ඇති වේ.

මේ ආදි හේතු නිසා වයසට යන විට තමන්ට පෙර පරිදි ක්‍රියාත්මක විය නොහැකි බව පුද්ගලයා ද අවබෝධ කර ගැනීම වැදගත් ය. බාල පරම්පරාව ඉතා ගෞරවයෙන් සහ ආදරයෙන් ඔවුන්ව බලා ගැනීම, ඇප උපස්ථාන කිරීම ධර්ම ගුණයකි; සමාජ වගකීමකි. සැලකිය යුතු ප්‍රමාණයක් දෙනා තමන්ගේ වගකීම යුතුකම අවබෝධ කර ගෙන ජ්‍යෝෂ්ඨයන්ව ආදරයෙන් ඇප උපස්ථාන කරමින් තමන්ට කළ හැකි උපරිමයෙන් බලා ගනිති. විශේෂයෙන් ම පැවිදි සොයුරියන්, ඇතැම් දූ පුතුන් මේ සත්කාරය සඳහා ඇප කැප වී ඇති බව දකින්නට ඇත. එහෙත් අවාසනාවකට එසේ නොකරන ඇතැම් අය ජ්‍යෝෂ්ඨයන්ට ඉතා පරුෂ වචනයෙන් ආමන්ත්‍රණය කරන නින්දා අපහාස කරන අය ද මේ සමාජයේ අපට හමු වේ.

එක්තරා මීසමක ධර්ම විවේකයක් කරන්නට පෙර නිවෙස් බැහැදකින විට වයසක දුප්පත් අම්මා කෙනෙක්, තම පුතා ගෙදර ආ විට තමාට කතා කරන්නේ "නාකිච්චි බත් උයලා ඉවර ද?" යනුවෙන් යයි කඳුළු පිරි දෙනතින් මට පැවසුවා ය. තවත් තැනක එක දුවක් මා සමඟ පැවසුවේ "මේ ගෑනි තවමත් මැරෙන්නෙ නැහැ" කියා පැවසුවේ, අංශබාග රෝගයෙන් වසර ගණනාවක් එක්තැන් වී සිටි තම මවට ය. මහළුකා, නාකියා, අපතයා යන වචන ඇතුළු මෙහි ලියන්නට අපහසු වචනවලින් වැඩිහිටියන් සහ දෙමව්පියන් අමතන අය ද මට හමු වී ඇත.

ජාතීන්ගේ විනිශ්චය දින දී ක්‍රිස්තුන් වහන්සේ අපට පවසන්නේ "මාගේ මේ සහෝදරයන්ගෙන් ඉතා සුළු තැනැත්තාට වුව ද ඔබ එසේ කළේ නම් එය කළේ මට ය" යන්න ය (මතෙව් 25:40).

ඕනෑ ම අසරණකමක් තුළ තව කෙනෙකු තුළ යැපෙන පුද්ගලයා සුළු වුවෙකි. ඔහුට හෝ ඇයට වතුර කෝප්පයක් දුන් විට පවා ජේසුස් වහන්සේගේ නාමයෙන් එය උත්තුංග ක්‍රියාවකි යන්න දේව වචනය පවසයි.

වර්තමාන පරම්පරාව වැඩිහිටියන්ට සහ ජ්‍යෝෂ්ඨයන්ට දක්වන නොසැලකිල්ල සහ අගෞරවය පිළිබඳ විවිධ කතා අපට ඇසෙයි. ඊට ප්‍රධානම හේතුව විය හැක්කේ බාල පරපුරට දිය යුතු ආදර්ශය වැඩිහිටියන් තුළින් ගිලිහී යාම යි. ඊට විවිධ හේතු ඉදිරිපත් කළ හැකි ය. කෙනෙක් වරදක් කරන විට එය වරදක් ලෙස පෙන්වීමට ඉඩකඩ ලැබෙන්නේ තමන් ඉන් වැළකී සිටින ප්‍රමාණයට ය. හුදු ජනප්‍රියතාව සොයන උදවිය වැරදි දේ වැරදි යැයි නො පවසන්නේ තමන්ගේ පැවැත්මට ඇතැම් විට එය ප්‍රශ්නයක් වන නිසා ය. අද බාල පරපුර කියන දේට වඩා කරන දේ ගැන සුපරීක්ෂාකාරී වෙති. අද ඇතැම් වැඩිහිටියන්ට, ජ්‍යෝෂ්ඨයන්ට බාල පරම්පරාවේ සමහරු ගෞරවය, ආදරය, සැලකිල්ල, අවධානය යොමු කරන්නට අකැමැති ය. සෑම ක්ෂේත්‍රයකම සිටින ජ්‍යෝෂ්ඨයෝ මේ ගැන සැලකිලිමත් වී කටයුතු කිරීම වැදගත් ය. නැතහොත් පසුව පසුතැවෙන්නට එය හේතුවක් විය හැකි ය. එසේ වුවහොත් ජ්‍යෝෂ්ඨයන්, වැඩිහිටියන් ගැන නො සිතන, අසංවේදී බාල පරම්පරාවක් බිහිවීම වළක්වන්නට නො හැකි ය යන්න අප තේරුම් ගත යුතු ය.

**සංස්කාරක පියතුමා**

# වැඩිහිටි අපේ ජ්‍යෝෂ්ඨයෝ

මව්පිය ගුණ ගැන ප්‍රශස්ති ගායනා කිරීම්වලට වඩා වැදගත් වන්නේ වයසට යන විට තම අවැසිතා ඉටු කර ගැනීමට, අබල දුබල වූ විට තම අවැසිතා ඉටු කර ගැනීම සඳහා මව්පියන්ට සරණ වීම යි.

ඔක්තෝම්බර් මාසය වැඩිහිටි මාසය ලෙස නම් කර තිබෙන තරම් රසයක් නොමැත. අතීතයේ ජ්‍යෝෂ්ඨයන් ලෙස නම් දරමින් බොහෝ සේවාවන් කර උදවිය අද හුදෙකලා වී ඇත. හුදෙකලා වූ ඔවුන් හෙළන සුසුමක් තුළින් ඇත්තේ වේදනාවක් මිස වෛරය, ක්‍රෝධය, ශාපය නො වෙයි. ඔවුන් හෙලන සුසුම් ශාපයක් වී එම දරුවන් වෙත පාරාවළල්ලක් සේ එන බව හතරවන පනත කඩ කරන දූ පුතුන් අමතක නො කළ යුතු ය. අප වසන ලොව අද කටුක වී ඇත්තේ නරක යයි හංවඩු ගැසී ඇති අය කරන නරක දේවල් නිසා නොවේ. යහපතක් කළ හැකි අය අයහපතක් නොකර අක්‍රිය වී සිටීම නිසා ය. දෙමව්පිය වැඩිහිටි අපි අධිෂ්ඨානශීලීව ක්‍රියාන්විත වෙමු. ජ්‍යෝෂ්ඨත්වයට තැන දෙමු. වයසත් සමඟ ම වැලඳෙන රෝග නිසා දුක් විඳින අය සමාජයට කරදරයක් යයි සිතන අය බොහෝ ය. සමහර අයට වැඩිහිටි හා දෙමව්පියන්ගේ අගය දැනෙන්නේ වයසට යන විටත් මිය පරලොව ගිය විටත් ය.

බුදු රජාණන් වහන්සේ දේශනා කළ පරිදි තමන්ගේ ම මව හා පියාට පමණක් නොව, තමන් ළදරු වියේ දී හදා වඩා ගත් පුංචි අම්මා වූ මහා ප්‍රජාපතී ගෝතමී දේවියටත් උන් වහන්සේ කළගුණ සත්කාර කිරීමෙන් වැඩිහිටියන් සැලකීමේ හා තමන්ට විවිධ වූ උතුම් උපකාර කළ අයට කළගුණ සැලකීමේ වටිනාකම ද පෙන්වා දී තිබීම විශේෂයෙන් ම මෙවන් කාල වකවානුවක මහඟු ආදර්ශයකි.


නෙල්සන් මැන්ඩෙලා මෙලොව ජීවත් වූ වසර ගණන 95ක් වුවත්, එයින් වසර 27 සිර ගෙදර සිටියත් වැදගත් වන්නේ ජීවත් වන කාලය කොපමණ ද යන්න නොව ලොව පුරා සුවහසක් පීඩිත ජනතාවගේ හදවත්හි ආදරණීය ලෙස මතකයේ තැන්පත් වී තිබීම ය. ලොව පුරා වෙසෙන මානව වර්ගයාගේ පොදු යහපත වෙනුවෙන් කටයුතු කළ මිනිසෙකුගේ මරණය අමරණීය ය. සාන්ත තෙරේසා මව්තුමියගේ චරිතය ද අපට ගත හැකි පාඩම් බොහෝ ය. සාර්ථකත්වය මෙන් අසාර්ථකත්වය ද, සිනහව කඳුළ තුළ ආදරය සංවේදී බව අත්දකිමින් රටට ම දුන් ආදර්ශය අපගේ ජීවිතයන්ට ද කදිම නිදසුනකි.

ළමා වියේ සිට යෞවනය දක්වා පිවිසී සිටින ඔබ අප වෙනුවෙන් තම කාලය, ශ්‍රමය, දහදිය, කඳුළු වැය කළ පර වී යන වියපත් මල් මෙන් අප ඔවුන්ව නොසලකා හරිනවා නොවේ ද? රැළි වැටී ගිය වියපත් මුහුණක සුන්දරත්වය හඳුනා ගන්නට තරම් අද අපේ සිත් සංවේදී ද? තනි වුණ, අසරණ වුණ, දැස් පිසලන්නට ඔබ සූදානම් ද? අසරණ වුණ, තනි වුණ ජීවිත දකින කල පයින් පැගී නොදැනි ම යනවා නොවේ ද? ආදරය, කරුණාව තුළින් ඔවුන් හා එක්වන්නට අප සූදානම් ව සිටිනවා ද? ළඟින් ඉන්න, සවන් දෙන්න, වැඩිහිටි ලොවට කළගුණ සලකන්නට ජ්‍යෝෂ්ඨයන්ට ගරු කරන්නට මීට වඩා අප කළ යුත්තේ කුමක් ද?

අප සැම ජ්‍යෝෂ්ඨයන්ට ම ගරු කරමින්, පිළිගෙන ආදරය තුළ නිහතමානීව, බැහැපත් වී සිනහවකින් වත් සිත් සනසන්නට සැමට හැකි වේවා යි ප්‍රාර්ථනා කරමු.

**කාමන් සකුන්තලා**
**විලගෙදර.**

# වෙමු ද අපි අපේ ජ්‍යෙෂ්ඨයන් හා සම...



"කවුරු ද කවුරු ද දැන් ලොක්කෝ
අපි ම යි අපි ම යි දැන් ලොක්කෝ..."

සත්‍ය වශයෙන් ම කිතුනුවන් වන ඔබට මට අපගේ කිතුනුකම පිළිබඳව ආඩම්බර හැඟීමක් තිබේ ද? මෙය අප අපගෙන් ම ඇසිය යුතු ප්‍රශ්නයකි. අපගේ ගැලවුම්කරුවාණන් විසින් ම ස්ථාපිත කරන ලද, එක ම, ශුද්ධ වූ, කතෝලික වූ සහ අපෝස්තුලුවරුන් විසින් පැවත එන අපගේ සභාව පිළිබඳව අප ආඩම්බර විය යුතු ම ය. අප අයත් මෙම ශු. සභාව එක් ගමකට, නගරයකට හෝ දේශයකට පමණක් සීමා වූවක් නොව, එය විශ්වීය සභාවකි. එම ශුද්ධ වූ විශ්වීය සභාවේ සාමාජිකයන් වීමට උතුම් වරයක් අප හට ලැබී තිබීම ම භාග්‍යයකි. මෙම උතුම් වරය අපට ලබා දීමට නම් මෙලොවෙහි සභාවක් ඉතිරි වී තිබිය යුතු ම ය. එම සභාව මෙතෙක් දුරටත් මතු අනාගතයටත් දායාද කිරීමට අපගේ ජ්‍යෙෂ්ඨයන් කෙතරම් දුරට මහන්සි වී ඇප කැප වන්නට ඇති ද? මහා බ්‍රහස්පතින්දා රාත්‍රියේ සීසීකඩ විසිරුණු අපෝස්තුලුවරු නැවත ආත්මයාණන් වහන්සේ තුළ බලය ලබා අපට මෙම සභාවේ සාමාජිකත්වය දැරීමට ඉඩ සලසා දීම වෙනුවෙන් නිතැතින්ම ඔවුන්ගේ ජීවිත පවා පුද දෙන්නට ඇත. විමසමු එසේ නම් වර්තමානයට අනුව අපේ සභාවේ 'ලොක්කන්' පිළිබඳව.

"ඔබ පේදුරු ය. මේ පර්වතය පිට මාගේ සභාව ගොඩනඟන්නෙමි. පාතාලයේ දොරටුවලට වුව ද එය බිඳ දැමිය නො හැකි ය" (මතෙව් 16:18). එදිනෙදා රැකියාව ලෙස ධීවර වෘත්තියේ නිරත වූ සීමොන් අද කතෝලික සභාවේ ප්‍රධාන කුළුනකි. පවුල් බර හිස මුදුනට තිබුණු, ධීවර ආම්පන්න සමග එදිනෙදා ජීවිතය පොර බැදූ, මහ මුහුද මුළු ජීවිතය ම කර ගත් පේදුරු ජේසුස් වහන්සේගේ එක වදනකින් ඒ සියලු දේ අතහැර දමා උන් වහන්සේ පසුපස ගොස් මුළු සභාවට ම මහා ආශීර්වාදයක් වී, අද සාන්තුවර නාමාවලියේ ඉහළින් ම නම සඳහන් වූ ජ්‍යෙෂ්ඨයෙකි. "පේදුරු මම ඔබ මිනිසුන් දිනන්නන් කරමි." ක්‍රිස්තුන් වහන්සේගේ එම අභිලාෂය අකුරට ම ඉටු කිරීමට සීමොන් පේදුරුට ආත්මයාණන් වහන්සේ තුළ හැකියාව ලැබිණි. ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රධාන කාර්යයන් සමග උරෙනුර ගැටුණු පේදුරු, 'ස්වාමිනි, මම පව්කාරයෙක්මි' යැයි පවසමින් තම පව්කාර බව පිළිගත්තේ ය. උන් වහන්සේගේ මරණ මංචකයේ දී ක්‍රිස්තුස් වහන්සේව නාඳුනන බව පිළිගත් පේදුරු ආත්මයාණන් තුළ ජෙරුසලම් චතුරස්‍රයේ දී හාරදහසකට පමණ කිතු දහම වැළඳ ගැනීමට ආසාවක්, උනන්දුවක් ඇති කළ දක්ෂ කථිකයෙකු බවටත් පත් වූවා නොවේ ද? මසුන් දැලට සමු දී කුරුස දැලට හසු වූ පේදුරුගේ අවසානය කුමක් වන්නට ඇති ද? පේදුරුගේ අවසානය සුන්දර අවසානයක් නො වන බව පැවසිය යුතු ම ය. දැලට මසුන් එකතු කරගන්නා සේ කිතුනු දහම නම් දැලට කිතුනුවන් එකතු කළ පේදුරුට අවසානයේ කුරුසියම හිමි විය. "මාව මාගේ ගුරුදේවයන් එල්ලා මැරුවා සේ නො මරන්න." මෙය පේදුරුගේ අවසාන ඉල්ලීම ය. එයට අනුව කුරුසිය උඩු යටිකුරු කළ ඇණ ගසා මරා දැමීමට සොල්දාදුවෝ තීරණය කළහ.

ලෝකයේ ජීවය ආලෝකය මත රැඳී තිබෙන්නා සේ, මත්ස්‍යයෙකුගේ ජීවිතය ජලයෙහි රැඳී තිබෙන්නා සේ, කිතුනුවාගේ ජීවිතය අපෝස්තුලුවරුන්ගේ රුධිරය මත රැඳී තිබෙන බව මතක තබා ගත යුතු ම ය.

වර්තමාන කිතුනුවන් වන ඔබ මම නිදහසේ දහම තුළ හුස්ම ගනු ලබන්නේ අපෝස්තුලුවරුන් තම ජීවිතය කිතු දහමට කැප කළ බැවිනි. කිතු දහම වෙනුවෙන් අපේ වගකීම අප ඉටු කර තිබේ ද? මඳකට නැවතී අපි අපගෙන් ම විමසමු.

අපෝස්තුලුවරුන්ගෙන් දායාද වුණු කතෝලික සභාවේ තවත් දෘශ්‍යමාන එඬේරෙකු ලෙස සේවය කළ දෙවන ජුවාම් පාවුලු පාප් වහන්සේ කිතුනු අපගේ ජීවිතවලට කදිම ආදර්ශවත් චරිතයකි. තමන්ගේ ජීවිතය විනාශ කිරීමට උත්සාහ කළ අලි අග්ගා ළඟට ම ගොස් වැලඳගෙන සමාව ලබා දීම උන් වහන්සේ මුළු ලොවට ම දුන්නේ කදිම ආදර්ශයකි. ක්‍රිස්තුස් වහන්සේ කුරුස ගස මත දී සිදු කළ දෙය ම උන් වහන්සේ මහ පොළොව මත සිදු කළ හැකි බවට තම ජීවිත ආදර්ශයෙන් ම මුළු ලොවට ම පෙන්වා වදාළ සේක.

උඩඟුකම වෙනුවට නිහතමානී බව පෙන්වූ, සංකීර්ණ ජීවිතය වෙනුවට සරල ජීවිතය ආදර්ශයක් ලෙස පෙන්වූ, දැහැමි ජීවිතය තම මුළු ලෝකය ම කර ගත්, උන් වහන්සේ කිතුනු අපට ආදර්ශයක් නොවේ ද? එවන් සභාවක සාමාජිකත්වය දරන අපත් එසේ විය යුතු නොවේ ද? වර්තමානයේ අපට අවශ්‍ය වන්නේ ද එවැනි චරිත ය.

කිතුනුකමට පණ පොවන, කිතුනුකම හදෙහි දරන කිතුනුවන් වීමට උත්සාහ කරමු.

**"වුණොත් සමත් අපේ ජෝෂ්ඨයන් හා සම**
**කිතුනුකමට එයි එළියක් අපගෙ ලොවට නව."**

බුද්ධික සඳරුවන්
දළුපත, ශා. අන්තෝනි සිද්ධස්ථානය.

# ජ්‍යේෂ්ඨයින් දැකගන්නට

දෙකට තුනට නැමෙනු නැතිව කිසි විට කිසිවකු හට
හිතට එකඟ ලෙස යුතුකම් ඉටු කළ හැටි සිහි කොට
නිවට නොවී හැකි වේ නම් සතුටින් දිවි ගෙවනට
එවිට හැකි ය නිසැකව ම ජ්‍යෝෂ්ඨයෙක් වන්නට

හිතේ එකක් සඟවා ගෙන නොගොසින් රඟ පෑමට
අතේ මිටේ හිඟමුත් යනු නොමැතිව අයැදීමට
කෙතේ පෙනෙන ගොයමක් මෙන් හසු වන මඳ පවනට
මතේ දෙරණ ජ්‍යෝෂ්ඨයින් කියනු හැකි ය ඔවුනට

දිවිය ගෙවන තැන දී හැමදාමත් එක වදනට
පිට නොපනින ගති තුළ රැඳෙමින් තාලෙන් තාලෙට
සෙත ම සදන බාධක අභියස නොසැලී සැම හට
පෙරට ඇදෙන සැවොම ජ්‍යෝෂ්ඨයින් වේ ය මිහිපිට

හතුරුකමක් නොරැඳෙන හිත තුළ මළු පිරෙනා විට
මසුරුකමින් යුතු නොවෙමින් හිස නොනමා බොරුවට
පතුරු වනු නැතිව කරුණු වරදින් බේරෙන්නට
ඉතුරු කරයි හොඳ නම මෙහි ජ්‍යෝෂ්ඨයින් සැම විට

හිඳිමින් ප්‍රතිපත්තිය තුළ නිති නොසැලෙන විලසට
නමමින් හිස නොරැඳි මල් මාල පලඳන විට
සතුටින් හැකි නම් දවසක මෙලොවින් සමු ගන්නට
මිනිසුන් ඒ වැනි සම වෙයි සැබෑ ජ්‍යෝෂ්ඨයිනට

තලෙන්තුවෙන් හිමිව තිබෙන ජන සෙත සැලසීමට
කැපවීමෙන් දිවි මගට මග පෙන්වූ සැම හට
ගරු කරමින් බරක් නොවී ඉපදුණු මිහිතලයට
ජ්‍යෝෂ්ඨයින් පණ දෙනු ඇත තවත් එවැනි අය හට

පුද කොට ආදරය සැබෑ ආදරවන්තියකට
ගත කොට දිවි නොමඳ සතුට ඇයට ලබා දෙන්නට
කෙනෙකුට හැකි නම් ආදරවන්තයෙක් ම වෙන්නට
සැම විට ඔහු ජ්‍යෝෂ්ඨයෙකි ආදර්ශෙට ගන්නට

**පස්කල් ජයමාන්න**
**උස්වැටකෙයියාව.**

# වැඩිහිටි විය

"සඳ නාවත් කමක් නැතේ රත්තරන් පුතේ... හිරු නාවත් කමක් නැතේ රත්තරන් පුතේ... ඕන දුකක් ඉහිලිය හැකි මහලු ජීවිතේ, එහෙත් පුතේ නුඹ නාවොත් දුක වැඩියි හිතේ..."

තම දුවා දරුවන්ගෙන් හුදකලා වූ පියෙකුගේ මේ වචන පෙළ ගීයක් ලෙසින් ඔබේ ද සවන් වැකී ඇතුවාට සැක නැත. දහසකුත් එකක් නිමා නොවන වැඩකටයුතුවල සිරවී මිරිකී සිටින දුවා දරුවන්ට තම මහලු වැඩිහිටියන්ගේ සිත් සතන් තුළ කැකෑරෙන සෝ සුසුම් නිවා දැමීමට කාලයක් කාලයා විසින් හෝ වෙන් කරන්නේ නම් කෙතරම් අගනේ ද?

වැඩිහිටි ප්‍රජාව යනු ප්‍රඥාවේ, අත්දැකීමේ, සමාජ සවියේ ආධාරක වේ. ශ්‍රේෂ්ඨ පුරවැසියන් ජාතියේ කොඳු නාරටිය බඳු ය. ඔවුහු ජීවිතයේ එක් එක් කාල පරිච්ඡේද තුළ එක් එක් කාර්තු ගෙවා නිම කර ඇත. ගංගාවක් අපමණ බාධා මැද සයුර සොයා යන්නාක් මෙන් ඔවුහු ද තම ජීවිතයේ ඒ ඒ කාල පරිච්ඡේද තුළ රස, නීරස, පහසු, අපහසු, භයංකර, දුක්ඛිත ආදි වශයෙන් විවිධ අන්දමේ ජීවිත අත්දැකීම්වලට මුහුණ දී ඇත. ඒ තුළින් ඔවුන් ලැබූ පන්නරය ඔවුන්ගේ ජීවිත දැවැන්ත මූල පද්ධතිය මිහි මඬල මත සිට අහස තෙක් නැඟී රුස්ස ගස් මෙන් සවිමත් කර ඇත. තව එකෙකුට ප්‍රයෝජනයක් ගත හැකි වන ආකාරයට අතුපතර විහිදී ඇත. එම නිසා ම රටක ජීවනාලිය වන් තරුණ ප්‍රජාවට ස්වකීය අත්දැකීම් මගින් වටිනා අවවාද, මග පෙන්වීම් දායාද කළ හැකි ය. සමහර විට පොතපතේ දැනුමෙන් හෝ පරක් තෙරක් නැති විභාග සමත් කිරීමක් නොවුණත් ඔහු ප්‍රඥාවේ උල්පත් බවට පත්ව ඇත. ඒ වසර ගණනාවක් ඔවුන් ගත කළ ජීවිතයේ අත්දැකීම් නිසාවෙනි.

එදා ගම් තුළ තම දුවා දරුවන් සමඟ එකට යාවී ජීවත් වූ වැඩිහිටියන් අද ජීවත් වන්නේ බොහෝ විට තම දූ දරුවන් මුනුබුරු මිනිබිරියන් 



සමග නොවේ. ජනප්‍රිය පාසල් කලාව හෝ රැකියා වෙළඳපළ පවතින නගර කරා දරුවන් සංක්‍රමණය වීම නිසා දෝ එසේ ම පවුල් පිටින් පිටරටවල පදිංචියට යෑම නිසා වැඩිහිටියන්ට තම වටිනා ජීවිත අත්දැකීම් බාල පරම්පරාව සමඟ බෙදා ගැනීමේ අවකාශය අඩු වී ඇත. එදා තම සීයා හෝ ආච්චි සමඟ රසවත් කතන්දර අසමින් ඔවුන්ගේ ආදර කරුණාව නො අඩුව ලබමින් සුන්දර ළමා විය සුන්දර සේ ම අර්ථාන්විත විය. වැඩිහිටියන්ගේ වටිනාකම සහ තවත් බොහෝ දෑ ළමා සහ තරුණ ප්‍රජාවට දැන ගැනීමට ඉඩ ප්‍රස්තාව තිබුණි. එම නිසා ම දෝ අදට වඩා යහපත් සාරධර්මවලින් පිරි සමාජයට වැඩදායී, සන්සුන් හා තෘප්තිමත් දරුවන් ලොවට දායාද වශයෙන් ලැබිණි. කාලයා විසින් ඔවුන්ට දරා ගැනීම, ඉවසීම නොසැලෙන බව වැනි ගුණාංග දායාද කර ඇත. ඒවා තුළින් තරුණ ප්‍රජාවට අවබෝධය ලබා දිය හැක. ඔවුන්ව දිරිමත් කළ හැක. එසේ ම සවිමත් ලෙස තම ජීවිත අභියෝගවලට මුහුණ දීමට සහ ජය ගැන්මට තරුණ ප්‍රජාවට මග පෙන්වීම කළ හැක්කේ වැඩිහිටි ප්‍රජාවට පමණි. ඇතැම් වැඩිහිටියන් පවුලට ම නායකත්වයක් දීම සේ ම පවුලට ආර්ථික ශක්තියක් ලබා දෙන අවස්ථා ද දක්නට ඇත.

එසේ ම ඔවුහු ආගමික සේවය හා ස්වේච්ඡා සේවයේ දී වැඩි වශයෙන් යෙදෙයි. ඔවුන් විසින් ම ගොඩනගා ගත් වැඩිහිටි සමාජ ඇත. එය ඔවුන්ගේ කායික හා මානසික සෞඛ්‍යයට ද

ඉවහල් වෙයි. වැඩිහිටි විශ්‍රාමකයින් ඇතැම් විට පාසල්, රෝහල් ආදී ස්ථානවල ස්වේච්ඡා සේවයේ යෙදෙන අවස්ථා ඇත.

වයසට යෑමත් සමඟ ම ඇතැම් විට ඔවුන් මුහුණ දෙන අභියෝග ශෝචනීය වේ. වයෝවෘද්ධ වූ පසු ඔවුන්ව දුරස් කර සලකන අවස්ථා දක්නට ඇත. වයසින් වැඩි වන විට තරුණ පරම්පරාව සහ අනෙක් අය ඔවුන්ට දරා ගැනීමට අපහසු කාර්යයකි. දුවා දරුවන්ගෙන් දුරස් වීම ද ඔවුන් කායිකව මානසිකව පරිහානියට ලක් වීමට බලපානු ඇත.

ඔවුහු බොහෝ විට නිදන්ගත රෝගවලින් පෙළෙති. චලන අපහසුතා ඇති වීම, වාරු නැති වීම, දියවැඩියාව හා ආඝාතය වැනි බෝ නොවන රෝග ඔවුන්ව පෙළනු ලබයි. එවැනි විටක අන් අයගේ අවධානය අඩු වීම සහ ආරක්ෂාව අඩු වීම වැනි කාරණා නිසා තව තවත් ඔවුන් කායිකව ද මානසිකව ද අපහසුතාවට ලක් වේ.

මූල්‍යමය හැකියාවක් ඇති ශ්‍රේෂ්ඨ පුරවැසියන් පවා මූල්‍යමය ගැටලුවලට මුහුණ දෙන අවස්ථා ඇත. ඇතැම් විට තම දරුවන්ගේ කටයුතුවලට මුදලින් දායක වීම හෝ දායක කර ගැනීම නිසා තමන්ගේ අසනීප හා පෝෂණය ආදී කටයුතුවලට වියදම් කිරීමට මුදල් ඉතිරි නොවන අවස්ථා ඇත.

මේ නිසා ඔවුන්ට අවශ්‍ය වෛද්‍ය පරීක්ෂණ සහ පහසුකම් වැඩි කළ යුතු ය. මානසිකව ඔවුන්ට ශක්තියක් විය යුතු ය. ඔවුන් සමඟ කාලය ගත කිරීමට කුමන වැඩ කටයුතු මධ්‍යයේ වුව ද කාලය සොයා ගත යුතු ය. ඔවුන් තවදුරටත් වටිනා පුද්ගලයින් ලෙස හැඟෙන පරිදි පවුලේ කටයුතු සඳහා ඔවුන්ව දායක කර ගැනීම ද මෙහි දී විශේෂයෙන් වැදගත් වේ. එය ඔවුන්ට විශාල මානසික සහනයක් ද ශක්තියක් ද වනු ඇත.

නිවසේ ඔවුන්ට ආරක්ෂිත පරිසරයක් සලසා දීමට ද විශේෂයෙන් අවධානය යොමු කළ යුතු ය. අද නිවෙස්වල ගෙබිම පහසුවෙන් ලිස්සා යන ආකාරයට සකසා තිබීම නිසා වැඩිහිටියන්ට සිදුවන අනතුරු බහුල ය.

වැඩිහිටියන් රැක බලා ගැනීමට මූල්‍ය තත්ත්වයේ බලපෑම ද යම් තරමකට ඇති බව සැබෑ වුවත් බොහෝ විට එය එසේ නොවේ. කරුණාබර වචනයකින් ඔවුන්ගේ විඩාබර දුබල ගතට හා සිතට ලබා දිය හැකි ජීවය අපමණ ය. වැඩිහිටියන් බොහෝ විට ඉල්ලා සිටින්නේ එවැනි කරුණාබර ආදරබර සැලකිල්ල ය.

අද වන විට වැඩිහිටියන් නොසලකා හැරීම, බහුලව සිදුවන බව කනගාටුවෙන් වුව ද කිව යුතු ය. ඇතැම් තැන්වල තම දරුවන්ගේ අධ්‍යාපන කටයුතුවලට බාධා වන බැවින්, දර මඬු වැනි හුදෙකලා, අනාරක්ෂිත තැන්වල පවා ඔවුන්ව තබන අවස්ථා ඇත.

මා අසා ඇති කතාවක් මෙසේ ය. පුතු විසින් දෙමහල්ව හැදූ සුඛෝපභෝගී නිවසේ පියාට වෙන්කර තිබුණේ උඩුමහලේ කාමරයකි. තමුන්ගේ කටයුතු පවා නිසි ලෙස කර ගැනීමට නො හැකි තත්ත්වයෙන් අබල දුබලව සිටි ඔහුට ඔහුගේ පුතු විසින් ඇඳට යා වන සේ සීනුවක් සවි කර තිබුණි. අවශ්‍යතාවයක් ඇති වූ විට එම සීනුව නාද කරන ලෙස පුතු විසින් පියාට දන්වන ලදී. මෙම ක්‍රියාවට දැඩි සේ විරුද්ධ වූයේ මෙම වැඩිහිටි පුද්ගලයාගේ මුනුබුරා ය. සීනුව වෙතට අත යැවීමට පවා අතපය දුබල තම සීයාට අපහසු බව මුනුබුරා විසින් පියාට දන්වන ලදී. නමුත් එයින් ප්‍රතිචාරයක් නොවී ය. එක් දිනෙක සීනුව දෙසට අත යැවීමට අසරණ වැඩිහිටි පුද්ගලයා ගත් වෙහෙස ද පෙන්නුම් කරමින් ඔහු අවසන් ගමන් ගොස් තිබුණි. මෙහි දී කිව යුතු වැදගත් ම සිදුවීම මෙය නොවේ. අර කුඩා දරුවා විසින් පියාට දන්වා පියාට අවශ්‍ය මතු දිනකට ප්‍රයෝජනයට ගත හැකි ලෙස අර සීනුව සුරක්ෂිතව තැබීම යි. තම වැඩිහිටියන්ට තමුන් සලකන ආකාරය ඔවුන්ගේම දරුවන් විසින් ආදර්ශයෙන් ඉගෙන ගනු ඇත. ඔවුන් අවශ්‍ය දිනක ලබාගත් දැනුම, අත්දැකීම තම මව්පියන් වෙනුවෙන් නොපිරිහෙළා ලබා දෙනු ඇත.

ප්‍රියංගනී කුමාරගම

# ජ්‍යෝෂ්ඨ - කනිෂ්ඨ පරස්පරතාව ගැටුමක් නොවන්නට...

අද සමාජය වයස් පරතර අනුව ස්ථරවලට වෙන් වී ඇත. ජ්‍යෝෂ්ඨයන් ඔවුන්ගේ අත්දැකීම් හා ගෞරවයත් සමග සමාජයේ ප්‍රමුඛ ස්ථානයක් හිමි කර ගෙන ඇති අතර කනිෂ්ඨයන් නව අදහස්, තාක්ෂණික දැනුම හා උද්යෝගය සමග සමාජය තුළ නව පියවරක් ගන්නා ජන කාණ්ඩයකි. නමුත් වසර ගණනාවක් තිස්සේ සමාජ සංවිධානය තුළ වයස් පරතරය පරම්පරා අතර පරස්පරතාවක් පෙන්නුම් කරයි. එය ජ්‍යෝෂ්ඨයන් හා කනිෂ්ඨයන් අතර මතවාදයක්, ගැටුමක්, හෝ සීතල යුද්ධයක් දක්වා වර්ධනය වී ඇත. මෙය ස්වාභාවික තත්ත්වයකි. නමුත් නිවැරදි හැසිරවීමක් නොමැති වීම සමාජයේ සහ පවුලේ ද ආයතනිකව හා කණ්ඩායම් තුළ ද අසමඟියටත්, අප්‍රසන්නතාවටත් මග විය හැක.

ජ්‍යෝෂ්ඨයන් යනු දිගු ජීවිතයක් ජය ගත් පරපුරකි. ඒ ඔවුන්ගේ අත්දැකීම් සහ චින්තනයන් මූලිකත්වයෙනි. තම අත්දැකීම් ඉගැන්වීමත්, තමන් දුටු පාර දිගු වශයෙන් කනිෂ්ඨයන්ට දැක්වීමත් ඔවුන්ගේ යුතුකමක් ලෙස ඔවුහු විශ්වාස කරති. සැම විට ම තමන් සිතන, දකින ආකාරය නිවැරදි යැයි ඔවුහු විශ්වාස කරති. මේ නිසා ඔවුහු කනිෂ්ඨයන්ගේ නව අදහස්වලට විවේචනීය බැල්මක් හෙළති.

අනෙක් අතට කනිෂ්ඨයෝ අද සමාජයේ හට ගෙන ඇති වෙනස් තත්ත්වයන් හඳුනා ගනිති. නව තාක්ෂණය, අන්තර්ජාලය, නව සමාජ පද්ධති, සංකල්ප නිසා ජීවිතය ගැන ඔවුන්ගේ දැක්ම ජ්‍යෝෂ්ඨයන්ට වඩා වෙනස් ය. එම නිසා ඔවුහු හණමිටි අදහස්වලට අභියෝග කරති. ඔවුන්ගේ අවශ්‍යතාව නම් දේශපාලනික නිදහස, නිර්මාණාත්මකතාවයට ඉඩ හසර හා නව මාර්ග සෙවීමේ අවකාශය වැනි දෑ ය.

මෙම ව්‍යාකූලත්වය බොහෝ විට උගත් පරිසරයන්හි ද, සේවා ස්ථානවල ද, අධ්‍යාපන ආයතන, පුහුණු මධ්‍යස්ථානවල ද දැකිය හැක. ජ්‍යෝෂ්ඨයන් දරන 'අපි දන්නවා', 'අපේ කාලේ' වැනි චින්තනවලට මුහුණ දෙන තරුණයෝ 'අපි වෙනස් වෙන්න ඕනේ' යන අදහස දරති.

මාර්ටින් වික්‍රමසිංහයන්ගේ 'ගම්පෙරළිය', 'විරාගය' කෘතින් මඟින් නව පරපුර පැරැන්නන් හා සම්ප්‍රදායන් ප්‍රශ්න කරන අතික්‍රමණය කරන අයුරු පෙන්වයි. සරච්චන්ද්‍රයන්ගේ 'මනමේ', 'සිංහබාහු' නාට්‍ය මඟින් ද ජ්‍යෝෂ්ඨ - කනිෂ්ඨ සට්ඨනය ඍජුව සාකච්ඡාවට බඳුන් නොවුණත් යුතුකම් හා ආශාවන්, කීකරුකම හා අනන්‍යතාව, උරුමය සහ නිදහස යන තේමාවන් ඔස්සේ වක්‍රාකාරයෙන් ජ්‍යෝෂ්ඨ - කනිෂ්ඨ සට්ඨනය ගැන සමාජගත කරයි.

ශ්‍රී ලාංකීය ජන සමාජයේ පාසල්, විශ්වවිද්‍යාල, වෘත්තිමය පුහුණු ආයතන, හමුදා පුහුණු කඳවුරු, ආගමික සංස්ථාවේ විවිධ නිකායන් තුළ, පූජක - පැවිදි පුහුණු ආයතන තුළ මෙම ගැටුම හෝ සීතල යුද්ධය අඩු - වැඩි වශයෙන් පවතී. විශ්වවිද්‍යාල තුළ 'නවක වදය' (වර්තමානයේ අධෛර්යයට පත් කර ඇති) බලයේ අසමතුලිතතාව නිරූපණය කරයි. පාසල් අතර වඩා ජනප්‍රිය 'බිග් මැච්' සංස්කෘතිය තුළ ද කනිෂ්ඨයන් පාසලේ අභිමානය විද්‍යමාන කරවීමටත්, ජ්‍යෝෂ්ඨ සම්ප්‍රදායන් රැක ගැනීමට කටයුතු කිරීමත් පරම්පරා චිත්ත ක්‍රියාවලියක ප්‍රතිඵලයක් පිළිබිඹු වෙයි.

එහෙත් මේ පරස්පරතා ඍජුව ම විරුද්ධතාවක් නො විය යුතු ය. මේ දෙපාර්ශවය ම සමාජයෙහි අවශ්‍ය අංගයන් ය. ජ්‍යෝෂ්ඨයන්ගේ අත්දැකීම් හා බුද්ධිමත් සිතුවිලි, තරුණ පරපුරට මග පෙන්විය හැකි ය. එමෙන් ම තරුණයන්ගේ උද්යෝගය, නවෝත්පාදන හැකියාවන් සහ තාක්ෂණික දැනුම සමාජ සංවර්ධනයට දායක කර ගත හැකි ය.

මෙම අභියෝගයට විසඳුම වන්නේ;

පරස්පරයෙහි ගෞරවය රැක ගැනීම හා අවංක සංවාදයේ නියැලීම යි. ජ්‍යෝෂ්ඨයන් තරුණයන්ගේ නව අදහස්වලට විවෘත විය යුතු අතර, තරුණයන් ද ජ්‍යෝෂ්ඨයන්ගේ අත්දැකීම්වලින් ඉගෙනීමේ ආශාවක් පවත්වා ගත යුතු ය. එකිනෙකාට අවකාශය ලබා දීමෙන් සමාජයෙහි ශක්තිමත් සහයෝගීතාවක් ගොඩ නඟා ගත හැක.


නිර්මාණාත්මක විසඳුම් මඟින් ද මෙම අභියෝගයට මුහුණ දිය හැක. ඒ සඳහා නිදර්ශනයක් ලෙස සත්‍ය සිදුවීමක් මෙලෙස ලියා දක්වමින් ලිපිය නිමා කරනු කැමැත්තෙමි.

යුධ සමයේ එක්තරා සේනාංකයක් වනගතව සතුරා සමඟ සටනට සූදානම් වෙයි. රාත්‍රීන් කීපයක් එලෙස වනයේ ගත කරන ඔවුන් උදෑසන මුහුණ දොවා ගැනීමට ඒ අසල කුඩා පොකුණක් වෙත ගොස් ඇත. හිමිදිරි උදෑසන ජ්‍යෝෂ්ඨ පිළිවෙළට ඔවුන් පොකුණේ දියෙන් මුහුණ දොවා ගෙන ඇත. මෙලෙස කැලඹුණු දියට අවසානයට බසින්නේ නිලයෙන් පහත් කනිෂ්ඨයන් විය. ඉන් එකෙක් පසුව කඳවුරේ බිත්තියක මේ ගැන පද පේළි 4ක් ලියන්නට විය.

"පිණි වතුර තරුවලට
මැද වතුර පටිවලට
මඩ වතුර පොඩි අපට
කොටි ගහල මදි තොපට"

මෙලෙස නිර්මාණශීලීව තම අදහස ප්‍රකාශ කිරීමෙන් තම සේනාංකයේ ජ්‍යෝෂ්ඨ - කනිෂ්ඨ ගැටලුවට සාධනීය විසඳුමක් ලබා ගැනීමට ඔහුට හැකි විය.

**තීක්ෂණ පෙරේරා**
**ශ්‍රී හෘදයේ ආධුනිකාරාමය,**
**'සිඳුපියනිල', බණ්ඩාරවෙල.**



## අඩ සියවසක රන් මෙහෙවර !

උතුම් පැවිදි බව ලබා පනස් වසරක් ගෙවී...
දේව මෙහෙයට කැපවී...
ආදරය කරුණාව උතුරා යන හදවතක් හිමි
අගරදගුරුතුමනි...
ඔබගෙන් කිතුනුවන් ඇතුළු ලක්වාසීන්ටත්
ඉටුවෙන උතුම් මෙහෙවර
කියා නිම කළ නොහැක
එදා... ලක්මව කඳුළින් නැහැවූ
ඒ නරුම පාස්කු ප්‍රහාරය නිසා...
සිදු වූ මහා විනාශය වෙනුවෙන්
සය වසරක් පුරාවට ඔබ තුමා හඬ නැඟුවේ
සාධාරණ විනිශ්චයක් වෙනුවෙනි...
තවමත් ඒ උත්සාහය අත් නොහැර සිටිමින්
අසාධාරණය සිදු වූ බැතිමතුන්ගේ ජීවිතවලට
සහනයක් ලබා දීම සඳහා
දරන ඒ නොනවතින උත්සාහය
මොන තරම් ප්‍රශංසනීය ද?
ඔබේ ගුණ වරුණ ලියන්නට
මේ පුංචි පත් ඉරුව...
ප්‍රමාණවත් නොවේ උතුමාණෙනි !
ඉදිරියටත් මේ උතුම් මෙහෙවරෙහි යෙදෙන්නට
ශක්තිය, ධෛර්යය සහ දීඝායු ලැබේවා !
අපේ අගරදගුරුතුමනි...

**ශ්‍යාමලී අනුරුද්ධිකා**
**පානදුර.**

# අතෙන් ගිලිහුණු දැහැමි පන්හිඳ



හලාවත පදවියේ ගරු සාර්ටෝ නෝනිස් පියතුමා බුද්ධිමය සීමාවන් පුළුල් කර ගනිමින් ලබා ගත් අද්විතීය දැනුම ළමුන්, තරුණ, වැඩිහිටි සැදැහැවත් ජනතාව පෝෂණය කිරීම පිණිස වැය වූ ආත්මික පියෙකු වීම උන් වහන්සේගේ පැවිදි ජීවිතයේ වැදගත්ම පියවර විය.

ලේඛන කලාවට යොමු වෙමින් ජේසුස් වහන්සේගේ සැබෑ හඬ ජනතාව අතරට ගෙන යන්නට ගත් වෑයම ප්‍රශංසනීය බව නොරහසක්. ඉමහත් ලැදියාවකින් හා ළෙන්ගතු බවකින් යාවජීවව 'භක්ති ප්‍රබෝධනය' සඟරා යුග මෙහෙවර ශක්තිමත් කරමින් ආලෝකය ලබා දෙන්නට උන් වහන්සේ දැක්වූ අනුපමේය සහයෝගය කෘතවේදීව සිහිපත් කරමු.

එකවර ලිපි කීපයක් පරිගණක තාක්ෂණයෙන් මුද්‍රණය කොට නිමවා, තැපෑලෙන් එවීම ම හිඟයකින් තොරව ලිපි සපුරා නියමිත සඟරාව පාඨක හැම අතට පත් කරන්නට ලද හැකියාවට උන් වහන්සේගේ මැදිහත්වීම බෙහෙවින් ම බල පෑ බව පැවසිය යුතු ම ය. භක්ති ප්‍රබෝධනය කාර්යාලයට පැමිණීමෙන්, දුරකථන ඇමතුම් මඟින් ප්‍රගතිය විමසා අප දිරිමත් කරන්නට නිරන්තරයෙන් අත්වැල් බැඳ ගැනීම උන් වහන්සේගේ ඇල්ම විය.

සාර්ටෝ නෝනිස් ගෞරවනීය පියතුමනි, අපේ සේවයට දුන් ජීවයට සදා ණයගැති බව පවසමින් ඔබවහන්සේට නිර්මල දේවමාතා වහන්සේගේ මැදහත්කම තුළ සගලොව දොරටු විවරව දෙව් මහෝත්මයාණන් වහන්සේගේ ශුද්ධවූ මුහුණ දැකීමේ භාග්‍යවන්ත මොහොත ඔබවහන්සේගේ ආත්මයට උදා වේවා යි හෘදයංගමව ප්‍රාර්ථනා කරමු.

සංස්කාරක පියතුමා, සහායක, ලේඛක හා පාඨක අපි.

සටහන - රූපස් ප්‍රැන්සිස්

# රුක්ස ගස් වැනි අපේ ජ්‍යෙෂ්ඨයෝ

අහසේ වලාකුළු අල්ලන්නට මෙන් ඉහළට ම නැගුණු,
සකල සතට සෙවණ දෙන්නට මෙන් සතර දෙසට ම විහිදුණු,
මහා රුස්ස ගසක් ගැන සිතන්න...
ඒ ගස තමාට නිසි කාලෙට මියැදෙනවා,
හැබැයි මේ ලෝකෙට රිසි අයුරින් ජීවත් වෙලා,
තවත් එවැනි ගස් සිය ගණනකට,
අවැසි පොහොර දමලා, පොළොව තනලා...
අන්න ඒ වගෙයි මටත්,
අපේ ජ්‍යෙෂ්ඨයෝ...
අප ආ මග දෙස හැරිලා බලද්දී,
සිහියට නැගෙනවා අගනා චරිත,
තම දිවි මනාව ගත කළ,
තම හැකියා, දක්ෂතා යොදවා,
එතුළින් ලොවට වටිනා යමක් එක් කළ...
ඔවුන් වැපිරූ යහපතේ බීජවලින්,
අදටත් අපි නෙළන්නෙමු යහපත් ඵල,
ඔවුන්ගේ හදවත් කෙතරම් සංවේදී ද?
ඒ ජීවිත කෙතරම් ආදර්ශවත් ද?
ඔවුන්ගේ ඒ නිමැවුම් කෙතරම් අගනේ ද?
ඒවායින් අපට ගත හැකි දෑ කෙතරම් ද?
රුස්ස ගස් වැනි මෙවැනි මිනිසුන්,
තැනූ මග රකිමින් ගොඩනැඟීම,
අපගේ යුතුකම නොවේ ද?
වංශෙ කබල් ගාලා විතරක් ම මදි,
ඒ වංශෙ තැනූ ඇරඹුම්, දෙසූ දම්,
අද අප අතර ජීවත් කරමු...
එවිට ඔවුන් තුටු වේවි, සැනසේවි,
ඔවුන්ගේ දහඩිය මහන්සිය,
අපතේ නොවේ, ඉදිරියට ම යනවා කියලා,
එතුළින් අද මිනිසුන් හෙට ලෝකෙට,
බලාපොරොත්තුවක් ඉතිරි කරගෙන කියලා...

**කීර්ති සඳරුවන් ප්‍රනාන්දු,**
**දිව්‍ය හෘදයේ නි. ම. නි. ආධුනිකාරාමය,**
**සිඳුපියනිල, බණ්ඩාරවෙල.**

# අපේ ජ්‍යෙෂ්ඨයෝ

පවසති ඉතිහාස කතා රජ කාලෙ කතා රස කරමින්නේ
ළමා ළපටි සැම දෙනා ම වට කර ගමිනේ
කොළොප්පමින් හොඳ නරකත් කියලා දෙන්නේ
අපේ ගමේ ජ්‍යෙෂ්ඨයන් නිති සිහි වන්නේ

වෙද මාමා ගුරු මාමා ගොවි මාමා ගමෙහි දෙටුවෝ
දරු පරපුර යහමගට ම නිති යොමු කෙරුවෝ
නැණ නුවණින් බත බුලතින් පිරිපුන් කෙරුවෝ
දියුණුව නම් අකුරු හතර ගම කෙලසූවෝ

කිතුනු දනා එකමුතු පවුලක් කරලන්ට
දෙව් වදනින් කිතුනු පවුල පොහොණ කරන්ට
මග පෙන්වන අවසන සුර සතුට විඳිනට
පතමු සභා ජ්‍යෙෂ්ඨයන් නිති වරමින් පුරවන්ට

සොබා දහම සුරකිමු ලස්සන දේශයක් සදන්න
තුරුණු ජවය යොදවමු රට යළි ගොඩ ගන්න
තම තමන්ගෙ දහම අනුව සාමෙන් ඉන්න
සැම විට උපදෙස් ගන්නට ජ්‍යෙෂ්ඨ සැම හා එක්වන්න

**අයිරින් කොස්තා**
**කඳවල.**

# සියලු සත්ත්වයෝ නිදුක් වෙත්වා ! නීරෝග වෙත්වා ! සුවපත් වෙත්වා ! දුකින් මිදෙත්වා !

## පසුගිය කලාපයෙන්...

ශ්‍රී ලංකාවේ නවක වදයට තිත තැබීමට නම් එය වැළැක්වීම සඳහා ගත හැකි පියවර, යෝජනා මෙන්ම එවැනි නවක වදය සම්බන්ධ සිද්ධීන් සිදුවූ පසු ඊට එරෙහිව ගත හැකි පියවර සම්බන්ධයෙන් ද දැනුවත් වීම ඉතා වැදගත් වේ. ප්‍රථමයෙන් දැනට දෙවන වසර ශිෂ්‍යයන් සමග ආචාර මණ්ඩලයට සම්මුතියක් ඇති කරගෙන නවකයන්ට 'නවක වදය' නො දිය යුතු බවත් එසේ කළහොත් ලැබෙන දඬුවම් සම්බන්ධයෙනුත් දැනුවත් කර ප්‍රතිඥා ලබා ගත යුතු ය. එසේ ම පළමු වසරට ඇතුළු වන සෑම ශිෂ්‍යයෙකුගෙන් ම තම අත්සනින් යුතුව නවක වධයට දායක නොවන බවට ප්‍රතිඥාවක් ලබා ගත හැකි ය. (කොළඹ විශ්වවිද්‍යාලයේ නීති පීඨයට අප ඇතුළත් වන විට අප සැමගෙන් එවැනි ප්‍රතිඥාවක් ලබාගත් අතර දැනට අප නීති පීඨය තුළ නවකවදය තුරන් කර ඇති බව සඳහන් කළ යුතු ය) එසේ ම එවැනි ක්‍රියාවන්ට සම්බන්ධ වන ශිෂ්‍යයන් සම්බන්ධයෙන් අදාළ විශ්වවිද්‍යාලයේ අනු නීති මගින් අභ්‍යන්තර විනය පරීක්ෂණයක් පවත්වා අදාළ ශිෂ්‍යයාගේ ශිෂ්‍ය භාවය අහෝසි කිරීම හෝ එම ආයතනයෙන් නෙරපීම ද සිදු කළ හැක. එසේ ම මෙවැනි සිද්ධීන් සම්බන්ධයෙන් නිර්නාමිකව පැමිණිලි කිරීමට, වාර්තා කිරීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මාර්ගගත පද්ධතියක් හඳුන්වා දී තිබුණ ද එහි ඇතැම් හිඩැස් පවතින බැවින් එය වර්ධනය කිරීම සඳහා අදාළ බලධාරීන්ගේ අවධානය යොමු විය යුතු ය. එසේ ම මෙවැනි ක්‍රියා වැළැක්වීමට හෝ අවම කිරීමට නම් පවතින නීති යාවත්කාලීන විය යුතු ය. එවිට විශ්වවිද්‍යාල පරිපාලනයට ද ආයතනික වගකීම (Duty of care) බැහැර කළ නොහැකි ය. එපමණක් නොව විශ්වවිද්‍යාලයට ඇතුළත් වීමේ දී සෑම ශිෂ්‍යයෙක් ම විධිමත් මානසික පරීක්ෂාවකට ලක් කිරීම මගින් ඔවුන්ගේ මානසික ගැටලු මගහරවා ගැනීමට ඔවුන්ට සහයෝගය ලබා දී අනාගත අපරාධකරුවන් දුර්මුඛ කළ යුතු ය. තවද ආතතිය අඩුකර ගැනීමට, ආකල්ප සංවර්ධනය කර පෞරුෂ හීනතා මගහරවා ගැනීමට සිසුන්ට වරින් වර මනෝවිද්‍යා මාර්ගෝපදේශන වැඩසටහන් සංවිධානය කළ යුතු ය. ශිෂ්‍ය ගැටලු සාකච්ඡා කළ හැකි, ඒවාට සංවේදී වන ශිෂ්‍ය අනුශාසකවරු සෑම විශ්වවිද්‍යාලයක් තුළ ම පත්කළ යුතු ය. විශ්වවිද්‍යාල කථිකාචාර්යවරුන්ට ද ශිෂ්‍යයන් සම්බන්ධයෙන් විශාල වගකීමක් පවතින නමුත් බොහෝ විශ්වවිද්‍යාලවල කථිකාචාර්යවරුන් පවා නවක වදයට සහයෝගය දක්වන බව කටුක යථාර්ථය වේ. නවක වදය තුරන් කිරීමට රාජ්‍ය ප්‍රතිපත්ති ද තවත් සංවර්ධනය කළ යුතු ය. ආණ්ඩුවට මේ සම්බන්ධයෙන් විමර්ශනය සඳහා විශ්වවිද්‍යාල තුළට බුද්ධි අංශ නිලධාරීන් යෙදවිය හැක. එසේම මෙවැනි නවක වදයට සම්බන්ධ වන ශිෂ්‍යයන්ගේ දත්ත ඇතුළත් පද්ධතියක් සකස් කර ඔවුන් අනාගත රැකියා සඳහා ඉල්ලුම් කිරීමේ දී අඩු ප්‍රමුඛත්වයක් ලබා දීම මගින් ක්‍රමිකව මෙම තත්ත්වය පාලනය කිරීමට හැකියාව ලැබුණු ඇත. විශ්වවිද්‍යාල පරිපාලනය දැනුවත් කිරීමෙන් ඵලක් නොවූයේ නම් මූලික අයිතිවාසිකම් නඩුකරයක් ගොනු කිරීමට මෙන් ම ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට මේ සම්බන්ධව විමර්ශනයක් සිදු කරන ලෙස ඉල්ලීමක් කිරීමටද වින්දිතයන්ට හැකියාව තිබේ.

ඉහත සඳහන් කළ කරුණු මගින් පැහැදිලි වනුයේ නවක වදය මුලිනුපුටා දැමීමෙහිලා තනි තනිව ක්‍රියා කිරීමෙන් ඵලක් නොවන බවයි. රජය, විශ්වවිද්‍යාල පරිපාලනය, ආචාර්ය මණ්ඩලය, විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්, පොලිසිය, අධිකරණය මෙන්ම නවක වදය මගින් වින්දිතයන් බවට පත්වූවන්ට ද මෙහිලා විශාල වගකීමක් පැවරේ. විශේෂයෙන් ම විශ්වවිද්‍යාල

ශිෂ්‍යයන්ට මේ සම්බන්ධයෙන් විශාල කාර්යභාරයක් සිදු කිරීමට තිබේ. ශිෂ්‍යාධාර, නේවාසිකාගාර හා වෙනත් පහසුකම් ආදි ශිෂ්‍ය අයිතීන් සම්බන්ධයෙන් පමණක් හඬ නඟන ශිෂ්‍ය සංගම් තමන්ගෙන් ඉටුවිය යුතු යුතුකම් අමතක කර දමයි. තම අයිතීන් වෙනුවෙන් හඬ නඟන, උද්ඝෝෂණ හා පෙළපාලි සංවිධානය කරන ශිෂ්‍යයින්ගෙන් නවක වදයට විරුද්ධව හඬ නංවන්නේ කොතරම් ස්වල්ප පිරිසක් ද? පවතින ක්‍රමය වෙනස් කරමින් රට සංවර්ධනය විය යුතු බව ප්‍රකාශ කරන නමුත් තමන් වෙනස් වීමට ඔවුහු මැළිකමක් දක්වති. ආසියානු කලාපය වැනි අඩු සංවර්ධිත රටවල නවක වදය බහුලව දක්නට ලැබුණ ද ඉතා දියුණු රටවල මෙවැනි ක්‍රියා දක්නට නොලැබේ. ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යයෝ ඉතා ආදරයෙන්, උත්සවශ්‍රීයෙන් විශ්වවිද්‍යාලයට නවකයන් පිළිගනිති. නවකයින්ට විශ්වවිද්‍යාල පරිසරය හඳුන්වා දී ඊට අනුගත වීමට හා අධ්‍යාපන කටයුතු කරගෙන යාමට ඔවුන් ඉතා මිත්‍රශීලීව සහයෝගය ලබා දේ. රටක් සංවර්ධනය කරා යන ගමනේ දී සිදු විය යුතු වෙනස මෙය නොවේ ද? ඈත අතීතයේ සමාජය ම්ලේච්ඡ වූ අතර මිනිසුන් ශිෂ්ටාචාරගත වූයේ තම හැසිරීම් ද ශිෂ්ට සම්පන්න කර ගනිමිනි. නමුත් නවක වදය ආදි අමානුෂික ක්‍රියා මගින් සිදු වනුයේ එසේ ශිෂ්ටත්වයට පත් වූ මානවයා නැවතත් අශිෂ්ට සමාජයක් වෙත රැගෙන යාම නොවේ ද? ශ්‍රී ලාංකිකයන් යනු තම සදාචාරය පිළිබඳව ඉතා පුරාජේරුවෙන් කතා කරන ජාතියකි. එවැනි සදාචාරයක් පවතී නම් තම සහෝදරයා හෝ සහෝදරිය නිරුවත් කිරීමට නො එසේනම් අමානුෂික වද හිංසාවලට ලක් කිරීමට හැකියාවක් පවතින්නේ ද?

එසේ ම ශ්‍රී ලංකාව යනු ආගම් හිස් මුදුනේ තබාගෙන අදහන රටකි. කිසිදු ආගමික ශාස්තෘවරයෙක් අනෙකාට හිංසා පීඩා කිරීමට තම දහම තුළින් අනුබලයක් ලබා නොදෙයි. බුදුරජාණන් වහන්සේ තම දර්ශනය තුළින් මෛත්‍රිය පතුරුවා මුළු සමාජයම සුවපත් කළ සේක. එසේ ම ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ තම ප්‍රේමයේ දහම තුළින් තම සහෝදරයාව තළා පෙළා දැමීමට ඉගැන්වූයේ නැත. උන් වහන්සේ පැවසූයේ "මා ඔබට ප්‍රේම කළාක් මෙන් ඔබත් එකිනෙකාට ප්‍රේම කරන්න" (ජොහාන් 13:34) යනුවෙනි. කතෝලික දහමේ හරය වනුයේ මමත්වය, තමකම අත්හැර දැමීම ය. තමා උතුම් ලෙස සලකමින් ක්‍රියා කිරීමක් කතෝලික දහමේ ඉගැන්වීම් තුළ නොමැත. නවක වදයේ අරමුණ සහෝදරත්වය වර්ධනය කිරීම නම් ප්‍රථමයෙන් අනෙකා උතුම් කොට සැලකීම වැදගත් ය. "සුහද සහෝදර ප්‍රේමයෙන් එකිනෙකාට ප්‍රේම කරන්න. ගෞරවයෙන් තමාට වඩා අනෙකා උතුම් කොට සලකන්න" (රෝම 12:10) යනුවෙන් ශු. බයිබලය ද අවධාරණය කරනු ලබයි. එසේ ම ජේසුස් වහන්සේ දේශනා කළේ "යමෙකු තමාගේ මිතුරන් උදෙසා දිවි පිදීමට වඩා උතුම් ප්‍රේමයක් කිසිවෙකුට නැති" (ජොහාන් 15:13) බව යි. උන් වහන්සේ ඒ බව තම ජීවිතාදර්ශය තුළින් මුළු මහත් මනුෂ්‍ය සංහතියේ ගැලවීම උදෙසා කුරුසය මත දිවි පුදමින් ප්‍රේමයේ පූජාවක් බවට පත්වෙමින් ඔප්පු කළ සේක. එසේ ම උන් වහන්සේ "අනුන් ඔබට යමක් කරනවාට ඔබ කැමති ද ඔබත් ඒ දේම ඔවුන්ටත් කරන්න" (මතෙව් 7:12) යනුවෙන් පැවසී ය. එමගින් අර්ථවත් වනුයේ අපට සිදුවනවාට අකමැති දේවල් අප විසින් අන් අයට සිදු නො කළ යුතු බවයි. පිරිසක් ඉදිරියේ නිරුවත් වීමට, අවමන් සහගත සැලකිල්ලට ලක්වීමට, වද හිංසාවට ලක්වීමට අප කිසිවෙක් කැමති නැත්නම් තම සහෝදරයාට ඒවා සිදුකිරීමේ දී ඒ ගැන සංවේදී වීම මනුෂ්‍යත්වයේ නාමයෙන් සිදුවිය යුතු ය. ඒ අනුව තමන් කනිෂ්ඨයන්ව සිටිය දී තමන් නවක වදයට ලක් වුව ද තමන් ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යයන් බවට පත් වූ පසු නවකයින්ට නවක වදය ලබාදීමෙන් වැළකී සිටීමෙන් තම ශ්‍රේෂ්ඨත්වය ලොවට විදහා පාන අතර එමගින් මෙම චක්‍රය නවතාලීමට පිටිවහලක් ලැබේ. මේ අනුව ප්‍රේමයේ දහම තුළ ක්‍රිස්තු අනුගාමිකයන් වන කතෝලික සරසවි ශිෂ්‍යයන්ට ද මේ සා විශාල කාර්යභාරයක් පැවරී තිබේ. මන්ද ජේසුස් වහන්සේ දුප්පතාට, විජාතිකයාට, කාන්තාවට, වහල් සේවකයන්ට සිදුවන අසාධාරණකම් වෙනුවෙන් පෙනී සිටියා

සේ ම අපත් සරසවිය තුළ සිදුවන නවකවදයට එරෙහිව හඬ නැගීම කතෝලිකත්වයට සාක්ෂි දැරීමකි. ජේසුස් වහන්සේ කන්ද උඩ දේශනාවේ දී පැවසූ පරිදි "යුක්තිය උදෙසා පීඩා විඳින්නෝ භාග්‍යවන්තයෝ ය. ස්වර්ග රාජ්‍යය ඔවුන්ගේ ය". (මතෙව් 5:10) එසේ නම් ස්වර්ග රාජ්‍යය කරා යන ගමනේ දී අයුක්තියට, අසාධාරණයට විරුද්ධව හඬ නැගීම ඉතා වැදගත් ය. ක්‍රිස්තුස් වහන්සේ තම ගෝලයින් තෝරා ගැනීමේ දී ඔවුන්ට නවක වදය දෙන ලද්දෙහි ද? නැත. උන් වහන්සේ ඔවුන්ගේ දුබලතා අමතක කර දමා ඉතා ආදරයෙන් ඔවුන් තමන් වෙත පිළිගත්තා නොවේ ද? එසේ නම් එම දහම අදහන කතෝලික සරසවි ශිෂ්‍යයන් වන අප සැම හෘද සාක්ෂියට එකඟව වචනයකින් හෝ නවක වදයට සහය නො දක්වා සරසවිය තුළ සහෝදරත්වයේ ප්‍රේමය පතුරවාලිය යුතු ය. "ක්‍රිස්තුස් වහන්සේ අපව මුදා ගත්තේ නිදහස්කම ඇතිව සිටීමට ය. එබැවින් දාසකම නමැති වියගහට නැවත යටත් නොවී ස්ථිරව සිටින්න" (ගලාති 5:1)

'සරසවිය රසවිය සවිය විය' යනු සරසවියේ සිටිනා ඔබෙත් මගේත් ජීවිතයේ ප්‍රියතම වචන කිහිපයක් ය. වසර දහතුනක පාසල් අධ්‍යාපනය නිමවා තරුණයෙක් තරුණියක් ලෙස සරසවිය කරා පිය නඟනුයේ බලාපොරොත්තු හා හීන කන්දක් පොදි බැඳගෙන ය. එසේ නම් අනෙකාව පරයමින් නොව අනිකා සමඟ සහෝදරත්වයෙන්, ප්‍රේමයෙන්, අව්‍යාජව, එක්ව ගමනක් යාමට සරසවි ශිෂ්‍යයන් ලෙස ක්‍රියා කළ යුතු වේ. සහෝදරත්වයේ නාමයෙන් තම මානසික තෘෂ්ණා තෘප්තිමත් කර ගැනීමට පෙලඹේ නම් එය සැබෑ මිනිසත්කමේ ලක්ෂණයක් නොවේ. රටේ පවතින නීතියට ද අවනත වෙමින් තම අයිතිවාසිකම් මෙන් ම තමාගෙන් ඉටුවිය යුතු යුතුකම් පිළිබඳව ද අවධානය යොමු කරමින් උසස් අධ්‍යාපනයේ ප්‍රමිතිය ද පවත්වා ගෙන, ඉතා සුන්දර සරසවි මතකවලින් පමණක් සපිරුණු, සදාචාර සම්පන්න, අධ්‍යාපනය සඳහා සුදුසු වටපිටාවක් විශ්වවිද්‍යාල තුළ නිර්මාණය කිරීම සඳහා සැම පාර්ශවයක් ම තම දායකත්වය ලබා දීම ඉතා වැදගත් වේ. නවක වදය තුරන් කිරීමේ දී මෙම චක්‍රය නැවැත්වීමට නම් මේ හා සම්බන්ධ සිද්ධීන්වල ප්‍රවෘත්තිමය වටිනාකම වියැකී ගිය පසු එම සිද්ධීන් යටපත් වීමට ඉඩ නොදී වින්දිතයන්ට යුක්තිය, සාධාරණය ඉටු කරමින් යහපත් හා ශිෂ්ට සම්පන්න සමාජයක් බිහි කිරීමට හඬ නැගීම කතෝලිකයන් වන අප සැමගේ මෙන් ම අන් අයගේ ද සමාජ වගකීමක් බව සිහි තබාගත යුතු ය.

**ෂෙලින්ඩා සමරසිංහ,**
**නීති පීඨය, අවසන් වසර,**
**කොළඹ විශ්වවිද්‍යාලය.**

# සම්භවය

ආවේ කොයිබින් දෝ
යන්නෝ කොයිබට දෝ
දිවිය පුරා - වෙහෙස දරා
හිතට හොරා විමසන්නේ

අඳුරු වෙරයේ පවුරු මැදින්
පඳුරු ලලා එන රුදුරු හැඟුම්
මත සැතපී මේ යන ගමනේ
නිම කොතැනේ - ඉම නො පෙනේ

කඳුරු නැගෙන සිත සිඳුරු කරන්
සොඳුරු ප්‍රේමයේ ඉවුරු බිඳන් //
සයුරු සොයා යන මේ ගමනේ
ඉම රැඳුණේ සුව සහනේ

**ඩබ්. ඩී. මැටිල්ඩා අධිකාරම්,**
**සුදම් පියස, තලාව.**

# ජුබිලි මංගල්‍යය ( කෙටි කතාව )

එය සුන්දර ගම්මානයකි. එහි ඇති දෙව්මැඳුර කුඩා නමුත් ඉතා අලංකාර ය, පැරණි ය. මනා ප්‍රෞඪත්වයකින් හෙබියේ ය. එහි ඉරුදින දිව්‍ය පූජාවට මුළු ගම්මානයේ ම සිටින කිතු බැතිමත්හු හැමෝ ම වාගේ සහභාගි වෙති. දිනක් දිව්‍ය පූජාව අවසානයේ පියතුමා තම හඬ අවදි කරවමින්,

"සහෝදර සහෝදරියනි, දිව්‍ය පූජාවෙන් පසු මොහොතකට නවතින්න. වැදගත් පණිවිඩයක් ඔබ හා සමග බෙදා ගැනීමට අවශ්‍ය යි."

එසේ කියා එතුමා තම හඬ අවදි කරමින්,

"ලබන වසරේ මේ දෙව්මැඳුරට අවුරුදු 150 ක් සපිරෙනවා. එය ඉතාමත් වැදගත් අවස්ථාවක්. අප එය උත්සවාකාරයෙන් සැමරිය යුතු යි. ඒ සඳහා මෙම දෙව්මැඳුර අලුත්වැඩියා කළ යුතු බව මට සිතෙනවා. මෙහි තැන තැන කැඩී බිඳී ගොස් තිබෙනවා. දෙව්මැඳුරේ බිත්ති සම්පූර්ණයෙන් ම අවපැහැ ගැන්විලා. මොගොප්පුවේ ගස්වැල් පැළ වෙලා. ඉතින් මේ අපේ දෙව්මැඳුර අලුත්වැඩියා කිරීමට මම කැමති යි. වර්ණ ගැන්වීමක් කළ යුතු යි. ඒ සඳහා අපට මුදල් අවශ්‍ය යි. ඒ වෙනුවෙන් අපි අරමුදලක් පිහිටුවා ගත යුතු යි. මම ඒ සඳහා යෝජනාවක් කරන්න කැමති යි. මම දින ගණනාවක් කල්පනා කරලා, යාච්ඤා කරලා ලැබුණ අදහසක් මෙය. මෙහි සිටින්නේ ඔබේම දූ දරුවන්, සහෝදර සහෝදරියන්. ඔවුන්ගේ ම සහභාගිත්වයෙන් නැටුම්, ගැයුම්, නාට්‍ය ඇතුළත් සංදර්ශනයක් පැවැත්වීම යි, ඒ අදහස. ඒ සඳහා සාධාරණ මුදලකට ටිකට් පතක් අපි නිකුත් කරනවා. එය මිල දී ගෙන නැරඹීම තුළින් ඔබට විනෝදයක්, සන්තෝෂයක්, දෙව් මැඳුර පිළිසකර කර ගැනීමට මුදලුත් ලැබෙනවා. මෙය අරමුදලක් පටන් ගැනීම පමණ යි. ඉන් පසු තවත් විවිධ කාර්යයන් මඟින් අරමුදල ශක්තිමත් කර ගත යුතු යි. අපි අදාළ අංශවලට කථා කර බලා අවශ්‍ය ඇස්තමේන්තු සකස් කර කොපමණ මුදලක් අවශ්‍ය දැ යි බලා ගත යුතු යි. මෙය මගේ අදහසක් පමණ යි. මේ ගැන ඔබලාගේ අදහස් උදහස් පසුව මට හෝ මීසම් සභාවට ලබා දෙන්න." යනුවෙන් ප්‍රකාශ කළේ ය.

පියතුමාගේ මෙම දැනුම්දීම ගැන බොහෝ දෙනා සතුට ප්‍රකාශ කළෝ ය. තම දෙව්මැඳුර අලංකාර වනු දැකීම සැමගේ ම ආශාව විය. නමුත් ඒ අතර කළු හංසයෝ ද සිටියහ. ඔවුන් කියන්නේ මේ දිනවල මිනිසුන් හට අමතර මුදල් වැය කිරීම අපහසු බව යි. එසේ ම දෙව්මැඳුර අලුත්වැඩියා කිරීම තුළින් එහි ඇති පෞරාණික බව නැති වෙන බවත් කියයි. තම මුතුන් මිත්තන් විසින් සෑදූ දෙව් මැඳුර නවීකරණය කිරීම ගැන විරුද්ධ වන්නෝ ද සිටියහ.

නමුත් තර්ක විතර්ක මැද කාලයක් ගත වෙද්දී පියතුමාගේ අදහස මුදුන් පත් විය.

ඉන් පසු එළැඹියේ කාර්යබහුල සමයකි. දහම් පාසල් දරුවනුත් තරුණ සමිතියේ දරුවනුත් නොයෙකුත් විශේෂාංග පුරුදු පුහුණු වනු දක්නට ලැබුණි. දරු දැරියෝ දෙව්මැඳුරු භූමිය තුළ දුව පැන ඇවිදිමින් තම ගුරුවර ගුරුවරියන් සමඟ තම පුහුණුවීම් කර ගෙන යති. තරුණ පිරිස ද බොහෝ උද්යෝගයෙන්, විවිධ අදහස් දක්වමින් නවීන නැටුම්, ගැයුම් මෙන් ම නාට්‍ය ද පුරුදු පුහුණු වෙති.

දිනක් පියතුමා දිව්‍ය පූජාව අවසානයේ කථා කරමින්,

"අපේ දුවා දරුවන් ඉතාමත් ආශාවෙන් උනන්දුවෙන් අපගේ විවිධ ප්‍රසංගයට සූදානම් වෙන අයුරු මම දකිනවා. අපට අතිදක්ෂ දරු පිරිසක් ඉන්නවා. මේ ඔබගේ ම දුවා දරුවනුයි. ඔවුන්ගේ දක්ෂතා බලලා සන්තෝෂ වෙන්න ඔබත් පැමිණෙන්න. සුළු මුදලකට ටිකට් පතක් මිල දී ගන්න. ඔබ වැය කරන ඒ මුදල අපතේ යන්නේ නැහැ. එයින් ඔබට සතුට ලැබෙනවා. දේවස්ථානයේ අලුත්වැඩියාවට මුදල් ලැබෙනවා. පරිත්‍යාගශීලී මහත්මයෙක් අපට නොමිලේ ටිකට් පත් මුද්‍රණය කර දීමට පොරොන්දු උනා. අපගේ මේ දේවස්ථාන භූමියේ ම සංදර්ශනය පැවැත්වීමට මම තීරණය කළා. එතකොට රංග ශාලාවක් වෙනුවෙන් මුදලක් වැය කරන්න අවශ්‍ය වෙන්නෙත් නැහැ. නමුත් අපේ

දරුවන්ට රඟ දැක්වීම සඳහා වේදිකාවක් අවශ්‍ය වෙනවා. ඒ සඳහා වැඩිහිටි පිරිමි අයගෙ උදව් මම බලාපොරොත්තු වෙනවා. තවත් විශේෂ දෙයක් කීමට තිබෙනවා. අප ග්‍රාමයට යාබද නගරයේ පිහිටා තිබෙන වැඩිහිටි නිවාසයටත් මම ආරාධනා කළා. ඔවුන්ගෙනුත් දර්ශන කිහිපයක් අපට ලබා දෙන බවට එහි සිටින කන්‍යා සොහොයුරියන් මට පැවසුවා."

මෙය ඇසෙත් ම සභාවේ තැනින් තැන සමච්චල් සිනාවන් නැඟිණ.

"ඇවිද ගන්නත් බැරි අය එහෙ ඉන්නෙ. එයාලා කොහොම ද නාට්‍ය කරන්නෙ?"

"අපේ සංදර්ශනයත් අවුල් වෙයි ද දන්නෙ නැහැ එයාලා ඇවිල්ලා."

"ගිලන් රථයක් ගෙනත් තියන්න වෙයි" වැනි කවට වදන් ද හුවමාරු විය.

"බලමු, බලමු, අපේ ෆාදර්නේ ආරාධනා කරලා තියෙන්නෙ. ඕව මේව කියන්නෙ නැතිව අපි අපේ ඒවා ලස්සනට කරමුකො" වැනි වදන් ද හුවමාරු විය.

කාලය ගෙවී ගියේ ය. විවිධ ප්‍රසංගය සඳහා සියල්ල සූදානම් විය. ප්‍රදේශයේ වැඩිහිටි පිරිස් බොහෝ වෙහෙස මහන්සි වී අලංකාර වේදිකාවක් සාදා දුන්හ. පිට්ටනිය ද සකස් කළෝ ය. නැරඹීමට පැමිණෙන්නන් හට හිඳ ගැනීමට ආසන ද සූදානම් කළෝ ය. ප්‍රසංගයේ ටිකට් පත් බොහෝමයක් අලෙවි විය. ගම තුළ ටිකට් පතක් නොගත් කෙනෙක් නැති තරම් ය. ගමෙන් පිටත නෑදෑ හිත මිත්‍රාදීන් වෙත ද ටිකට් පත් අලෙවි කළෝ ය. ප්‍රසංගය පැවැත්වෙන දිනය පැමිණියේ ය. එය සවස 3.00 ට ආරම්භ වන නිසා, උදේ සිට ම දේවස්ථාන භූමියේ විශාල කලබලයකි. තැනක කවි ගායනා කෙරෙයි. තැනක නාට්‍ය දෙබස් කියැවෙයි. තව තැනක නැටුමකි. වේලාව ළං වෙද්දී සැම දෙනා ම තමන්ට නියමිත ඇඳුම් පැලඳුමින් සැරසෙමින් සිටියහ. දහවල් 2.00 පසු වෙද්දී ප්‍රේක්ෂකයෝ පැමිණෙන්නට පටන් ගත්හ. සවස 3.00 වෙද්දී රංග භූමිය අතුරු සිදුරු නැතිව පිරී ගියේ ය. තිරය ඇරිණ. ජාතික ගීය ගැයීමට දරුවන් පෙළ ගැසිණ. සියල්ලෝ ම නැඟී සිට ජාතික ගීය ගැයීමට සහභාගි වූහ. එය අවසානයේ දී පියතුමා සැවොම සාදරයෙන් පිළිගෙන සංදර්ශනය ආරම්භ කිරීමට දහම් පාසලේ ගුරුතුමියකට ආරාධනා කළේ ය. මුලින් ම පුංචි දරුවන්ගේ සුරතල් නැටුමකින් වේදිකාව වර්ණවත් විය. එක් එක් අංශයෙන් විවිධ ඉදිරිපත් කිරීම් තිබුණි. ඒවා එකකට එකක් නොදෙවෙනි ලෙස ඉතා අලංකාර විය. මනා ලෙස පුරුදු පුහුණු වී තිබුණ බව ද පෙනී ගියේ ය. ඒ අතර වැඩිහිටි නිවාසයේ නාට්‍ය දර්ශනයකට ආරාධනා ලැබුණි. තිරය ඇරුණි. පැරණි නාට්‍ය අනුසාරයෙන් පොතේ ගුරා පැමිණියේ ය. උස් හඬින්, කාව්‍ය භාෂාවෙන් නාට්‍යය හැඳින්වීම කළේ ය. ඔහුගේ ගැඹුරු කට හඬ රංග භූමිය පුරා ම විසිරී ගියේ ය. මුළු සභාව ම නිශ්ශබ්ද විය. නාට්‍ය ආරම්භ විය. නළු නිළියෝ සැවොම වයස්ගත වූවෝ ය. නමුත් ඔවුන්ගේ නොනැසුන ජවය ශක්තිය මනාවට පිළිබිඹු විය. කාව්‍ය භාෂාවෙන් මෙන් ම ගද්‍ය භාෂාවෙන් ද නාට්‍ය හැඩ වී තිබුණි. නළු නිළියන්ගේ කට හඬ නාට්‍යයේ චරිතවලට අදාළ ලෙස උස් පහත් වෙමින්, ළයාන්විත මෙන් ම ගාම්භීරව ද ගලා ගෙන ගියේ ය. එම නාට්‍ය රැස්ව සිටි සැම දෙනාගේ ම මහත් සතුටට හේතු විය. නාට්‍ය අවසානයේ මහා අත්පොළසන් නාදයක් අවට සිසාරා ගියේ ය. සැවොම ආසනවලින් නැඟී සිට ඔවුන් හට ගෞරව කළෝ ය. ඉන් පසු දිගට ම නොයෙකුත් නිර්මාණ ඉදිරිපත් කෙරිණ. අවසානයේ වැඩිහිටි නිවාසයෙන් තවත් භාවාත්මක පැරණි ගායනා දෙකක් ඉදිරිපත් කෙරිණ. ඒවා ඉතාමත් ළයාන්විත ගායනා විය. ඝෝෂාකාරී සංගීතයෙන් මිදී, සැදෑ අඳුරක් සමඟ ඇදී ආ ඒ සුමිහිරි ගායනාවලින් සැමගේ ම සිත් සවන් නිවී පහන් විය.

බොහෝ අලංකාර වූත් අර්ථවත් වූත් නෙත් සිත් සවන් පිනවූත් සැඳෑවක අවසානයේ පියතුමා ජයග්‍රාහීව වේදිකාවට අවතීර්ණ විය. එතුමාගේ මුහුණ ප්‍රීතියෙන් බැබළුණි. එතුමාගේ ස්තූති කථාවේ දී වැඩිහිටියන්ගේ ඉදිරිපත් කිරීම් ගැන බොහෝ ප්‍රශංසා කළේ ය.

"ඔබ අප කවුරුත් නොසිතූ ලෙස අපගේ මේ වැඩිහිටි මව්පියවරු අපිව සන්තෝෂ කළා. අපගේ ප්‍රසංගය අර්ථවත් කළා. එම නිවාසයේ බොහෝ ඇසූ පිරූ තැන් ඇති අය සිටින බව මම දැන

ගෙන සිටියා. මම එහි දිව්‍ය පූජාව පැවැත්වීමට යන දිනවල ඒ දෙමාපියන් සමග කථාබහ කළා. එවිට මම ඔවුන්ව හඳුනා ගත්තා. එම නිසා මම විශ්වාස කළා, එයාලට සාර්ථක නිර්මාණ කිහිපයක් අපට දෙන්න පුළුවන් වෙයි කියලා. මේ නාට්‍යය ඔවුන්ගේ ම නිර්මාණයක්. එය ඉතාමත් ආදර්ශවත් මෙන් ම කලාත්මක නිර්මාණයක්. ඔවුන් ඉදිරිපත් කළ ගීත දෙකත් ඉතා මිහිරි යි. මම ඒ වැඩිහිටි මව්පියවරුන්ට සහ එහි කන්‍යා සොහොයුරියන්ට බොහෝ සේ ස්තුතිවන්ත වෙනවා. ඔවුන් අපේ ජ්‍යෝෂ්ඨයෝ. එයාලා මේ ලෝකෙ ලස්සන කළ නිසා තමයි ඔබලාට මෙවන් ලස්සන ලෝකයක් ලැබිලා තියෙන්නෙ. දැන් මේ බාල තරුණ දරුවන් මේ ලස්සන ලෝකය බාර අරගෙන ඉදිරියට ගෙන යා යුතු යි.

අනෙක් නිර්මාණත් ඉතාමත් අලංකාර සහ බොහෝ සාර්ථක නිර්මාණ බව මගේ හැඟීම යි. මේ ගුරුවර ගුරුවරියන්ගේත් දෙමාපියන්ගේත් කැපවීම මත මෙවැනි ලස්සන සැඳෑවක් අපට ලබා දීම ගැන දෙවියන් වහන්සේට මුලින් ම මම ස්තුතිවන්ත වෙනවා. අපගේ මේ දරු දැරියනුත් බොහෝ වෙහෙස මහන්සි වූ බව මම දන්නවා. මේ සඳහා අලංකාර වේදිකාවක් තනා දුන් අපේ වැඩිහිටි පිරිසටත් මම ස්තුති කරනවා. මේ ග්‍රාමයේ කුඩා දරුවාගේ පටන් සැම දෙනාට ම මම දේවාශීර්වාදයත් ස්තුතියත් පුද කරනවා. අපගේ දෙව්මැඳුරේ ප්‍රතිසංස්කරණය සඳහා වන අරමුදලේ මුල් මුදල සඳහා ලොකු මුදලක් අපට ලැබී තිබෙනවා. තවත් යම් ප්‍රමාණයක් අපි, සොයා ගත යුතු යි. ඒ සඳහා මේ ප්‍රදේශයේ සිටින ව්‍යාපාරික මහතුන් කිහිප දෙනෙක් සහයෝගය දෙන්න කැමැත්ත ප්‍රකාශ කරලා තියෙනවා. එම නිසා අපි දැන් අපගේ දෙව්මැඳුරේ ජුබිලි මංගල්‍යය පැවැත්වීම සඳහා දෙව්මැඳුරේ අලුත්වැඩියා කටයුතු පටන් ගැනීමට සූදානම් වෙමු. මේ සැම දෙනාගේ ම යාච්ඤා සහ උදව් උපකාර මම බලාපොරොත්තු වෙනවා" යනුවෙන් පියතුමා තම කථාව අවසාන කළේ ය. රැස්ව සිටි සැවොම ඉතාමත් ප්‍රීතියෙන් නැඟී සිට නොනවත්වා ම අත්පොළසන් දුන්නෝ ය.

ඇග්නස් චන්ද්‍රකාන්ති ජයමාන්න

# ඩබ්. ඔල. පීරිස්... ලුණු කැටයක් !

ලුණු කැටයක් ලෙසින් දිය විය යුතු ය කියා
වදනක් දහම් පොත් මුදුනේ තිබුණි ලියා
එය දැන හැඳින මුළු දිවිය ම පිදුව එයා
ගුරු දෙවි පදවි ලැබුවා ඒ මහරු පියා

ආනා විදුහලේ විදු ගුරු ලෙසින් රැඳී
පානා ගුණ සුවඳ දරුවන් සමඟ බැඳී
නානා සිතුම් ඇතියන් රඟ හලක හිඳී
ගේනා රැඟුම දැක මුල් තැන පුදන ලදී

කිතු සමිඳුන්ව ගුරු දෙවියන් ලෙස වැලඳ
මුතු එක් කළා මාලයකට ගෙල පැලඳ
යුතුකම ඉටු කළා මුළු දිවියෙන් නිබඳ
"කිතු ගුරු එකතුවක්" හැදුවේ තනිව හිඳ

රජයේ සේවයෙන් එළියට ඇද දැමුවත්
යුගයේ අවැසිතා හඳුනා ගෙන පොහොසත්
සගයේ දොරටු ඇර දෙන්නට ගත් වෙහෙසත්
ඇගයේ නිහඬ සේවය නො බිඳී කවදත්

රට වට යමින් කිතු මෙහෙවර ගත් අතට
අට පහ නොදත් අය හට මඟ විවර කොට
සැට විය ගෙවා තිස් වසරක් නිමා කොට
කට නැහැ වැසී හෙටටත් හඬ දෙයි යසට

හයක් දූ පුතුන් සතු බලවත් පියෙකි
දොළොසක් මුණුබුරන් හිමි රජ පරපුරකි
සග ලොව දිනූ බිරිඳකි රැකවරණයකි
ඉන්ද්‍රඛීලයකි, පහනකි, රන් වැටකි

"ලුණු කැටයක්" වෙනුවෙන් නොලියා කවියක්
මගෙ මහ කවිකමෙන් බිඳකුදු නැහැ එලයක්
සැමටම ලබා දුන් ජීවන පන්නරයක්
ඔබ මේ රටට නොව ලොවට ම "මිණි කැටයක්"

ඩබ්. ඩී. මැටිල්ඩා අධිකාරම්
සුදම් පියස, තලාව.

# ජේසු නිකායේ නිර්මාතෘ ශුද්ධවූ ඉග්නේෂියස් ලොයොලා මුනිතුමා



1491 වසරේ දී ස්පාඤ්ඤයේ මන්දිරයක් විය. එහි නම වූයේ 'බාන්ස් ලොයොලා' යන්න යි. මෙම මන්දිරයේ ඉතා වංශවත් මවුපිය යුවළකට දාව වැඩිමහල් සොයුරියන් තිදෙනෙකු හා සහෝදරයින් දෙදෙනෙකුගෙන් යුක්ත පවුලේ බාල පුත්‍රයා ලෙස ඉග්නේෂියස් නම් වූ දරුවා ජන්ම ලාභය ලැබී ය.

ඉතා ධනවත් පවුල් පසුබිමකින් පැවැත ආ මෙතුමාට ස්වකීය ළමා කාලය ඉතා සැපවත් අන්දමට ගත කිරීමට සිදු විය. යොවුන් වියට එළැඹීමත් සමග එම රටේ රාජකීය හමුදාවට සම්බන්ධ වූ මොහුට එම හමුදාවේ කපිතාන් තනතුරක් හිමි විය. එතුමාට පැවරී තිබුණේ "පච්හලුනා" නැමැති බලකොටුව, ප්‍රංශ හමුදාවලින් ආරක්ෂා කර ගැනීමට ය.

මෙම භාර ධූර වගකීම, අභීතව සිදු කිරීම සඳහා මෙතුමා ඉදිරිපත් වූව ද ප්‍රංශ හමුදා අතර ඇති වූ සටනක දී, වෙඩි ප්‍රහාරයකට භාජනය වන්නට මෙතුමාට සිදු විය. එහි ප්‍රතිඵලයක් ලෙස මෙතුමාගේ පාදයක් තුවාල වූ අතර වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමෙන් පසුව ද මෙම තුවාල සුව වීම සඳහා මාස ගණනාවක් ගත විය. මේ ආකාරයට ඔත්පල වී ලොයෙලා මැඳුරට වී කාලය ගත කළ මොහුට ආධ්‍යාත්මික වටිනාකමකින් යුත් පොතපත කියවීම සඳහා ඉඩ ප්‍රස්තාව ලැබිණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ඔහු තුළ පැවැති රණකාමී සිත වියැකී සිය ජීවිතයේ ශූන්‍ය බව අවබෝධ කර ගත්තේ ය. මෙතුමා ජේසු තුමා වෙත යොමු වීමට සිතා ගත් අතර ඔහුගේ ඒකායන බලාපොරොත්තුව වූයේ ක්‍රිස්තුන් වහන්සේ වෙනුවෙන් වඩාත් යහපත්ව ජීවත් වීම ය.

අභ්‍යන්තරික සිත් පෙරළියකට භාජනය වී සිටි ඔහු වෙත ස්වප්නයකින් දේව මෑණියන් දර්ශනය විය. එතුමියගේ ආරාධනය පිළිගෙන ටොන්සෙරට්හි එතුමියගේ වන්දනා ස්ථානය කරා ගියේ ය. ඉන් අනතුරුව මෙතුමෝ "මැන්ඩ්රිසා"හි අවුරුද්දකට අධික කාලයක් ජීවත් වූ අතර එම අවධියේ මෙතුමාට දොමිනිකාන සොයුරන් සමග ද, තවත් අවස්ථාවක දිළිඳු ජනතාවගේ නිවෙස්වල ද, කඳු මත තිබූ ගල් ගුහාවල ද යාච්ඤාවට ප්‍රමුඛත්වය දෙමින් විසී ය.

එදා පටන් අද දක්වා මොහු කිතුනු සභාව සඳහා ඉතා විශිෂ්ට මෙහෙවරක් සිදු කර ඇත. ජේසු නිකායේ සාමාජිකයන් බොහෝ තැන්වල විවිධ සභා විරෝධී බලවේගවලට විරුද්ධව කිතුනු සභාවේ ඉගැන්වීම ආරක්ෂා කර ගැනීම සඳහා ඉතා විශාල ප්‍රයත්නයක් දරා තිබේ. මේ වන විට රාජ්‍යයන් 112ක පමණ ජේසු නිකායිකයෝ ඉතා විශාල සේවයක් කරති.

සග සැපත් ෆ්‍රැන්සිස් පාප් තුමා ද ජේසු නිකායික පියතුමෙක් විය. සාන්ත ඉග්නේෂියස් ලොයෙලා තුමා වර්ෂ 1556 ජූලි මස 31 වැනිදා සමිඳුන් වතට වත දී බැලීමට මෙලොවින් සමු ගත්තේ ය. මෙතුමා මරණයට පත් වූයේ රෝමයේ ය. අධ්‍යාපනය කෙරෙහි මධ්‍යස්ථ වන මුනිවරයා වශයෙන් මෙතුමා පිදුම් ලබයි. එසේ ම ස්පාඤ්ඤයේ ආරක්ෂක මුනිවරයා ලෙස ද ප්‍රකට වී ඇත.

**මලින්ත බෝපෙආරච්චි**
**දලුගම, කැලණිය.**

## හැරී බලනට පෙර එබී බලමු...

බලනට නිහඬව නිවන සලසනා ශ්‍රී මහා බෝධී රුක් මහිමේ
ළපටින සියුමැලි දසුනක ලෙළවන බට දඬු එලෙසට නොම වන්නේ
දැකුමට රඟ දෙන සිදාදි ගැටයන් මෙන් නොව චරිත කථා අතරේ
සම කළ හැකි මොන දේට ද ශ්‍රේෂ්ඨ වැඩිහිටි පදනම මේ දෙරණේ

මුහුකුරා ගොස් වයසින වැටහුම කිමෙක් ද බව අප දැන යුත්තේ
අත්දැකීම් මතින් ශ්‍රේෂ්ඨ වන්නට කාලය දොරගුලු හැරලන්නේ
අත්මිටි සන්දියේ තරමට දැනුමැති අප ඒ පිළිබඳ මොන දන්නේ
යුතුකම ගෞරව දක්වත ඉහළින වැඩිහිටි නාමෙට පෙරටු පයේ

පෙම් ගුණ දම් දහරා වස්වා උන් ඇති දැඩි කර සක්විති රජු සේ
දක්වත කෙලෙස ද ගෞරව ඔවුනට පිදුමට නැත පැතුමෙන් තිළිණේ
දොක්කන් ඔවුනට සෙවණ තනාලන් සුනබ නිවහනේ දොර හැරියේ
කෙලෙස් ගති නිරුද හිස් මිනිසුන් ම ය, එවැනි කථාවල චරිත වූයේ

තාක්ෂණේ හරි හාස්කමක් මෙනි නාඹර ගැටයන් සලකනුයේ
ඔවදනක් හෙම දෙසුහොතින් වැඩිහිටි බැව් නැත උන් හඳුනනුයේ
නිසි දේ මෙය මැ යි සිතාපු බොලඳුන් අනාථ වී ඇත කුණාටුවේ
නොඅඩක් වේ මැය පිළිගතහොත් වැඩිහිටියන් දැනුමින් දෙසනා දේ

පෙන්වන්නට අගුණක් ඔපලා මේ ශ්‍රේෂ්ඨ පුරවැසි දනන් වෙතේ
සිතනු මදක් හිඳ දවසක නුඹගෙ ද කල වයසම තටු සලන රගේ
තතු විත්තිය පැදි පෙළේ අතරින් නුවණට පහදා දී ඇත මෙලෙසේ
වඩවමු අප පෙම්, වැනුමට ඇගයුම නිති දින ජ්‍යෝෂ්ඨ හිත් පතරේ

**ගරු රවිඳු ප්‍රශාන්ත සහෝදරතුමා**
**දහම් සෙවණ, ජේසු නිකායික ආධුනිකාරාමය, කුරුණෑගල.**

## හෙට කතා කරමු

හෙට කතා කරමු
හෙට කතා කරමු
තනිකම පාළුව අද යන්න
හෙට අපි කතා කරමු


සිය ගණන් දත් අය අතරේ
සතුටු සාමිචි කතා අතරේ
කුටියක තනි වූ රාත්‍රියේ
තනිකම වට කළ රාත්‍රියේ

අඳුර ගලා හැලෙනා අතරේ
හිත දුවයි එහා මෙහා ගමනේ
දැනෙයි බැරිකමක් හද පතුලේ
පාළු තනිකම හද තැළුවේ

තනිකම උගුලකි කරදරේ
වෙලා නොගනින් හද මගේ
ආලෝකේ වචනේ බලේ
පාළුව අඳුර මැකී ගියේ

**CJED**

## ඔබ ම ය සමිඳුනි ආධාරේ



**හැරී ලැම්බට් වාස්,**
**වෙන්නප්පුව.**

වම් කකුලේ සුළු තුවාලයක් වී සතියක් ගෙවුණු තැනේ
හැත්තෑ හය වසරක් සපිරූ මා රෝහල වෙත යැවුණේ
සලාපුරේ මහ රෝහලෙ සිදුවූ පැතලොජී පරික්ෂණේ
සටහන් කර තිබුණා දුටුවේ මා "අපේක්ෂා"වෙ වරුණේ

මාරවිල හා මහරගමේ රෝහල් වෙත යැවුණු සැණේ
සුවය පතා නෑ මිතුරන් අත දී පෙන්වූ සොයුරු පෙමේ
රෝහල් කාර්ය මණ්ඩල සැම තුළ අත්දුටු මිනිස් පෙමේ
පුදසුන අබියස දණින් වැටෙන්නට යළි මට පිහිට වුණේ

සුදත් බෙලෙන් කළ රෝග විමසුම් ඖෂධ ප්‍රතිකාරේ
ලිව්වා මතකයි සමිඳුනි ඔබහැර කවුරු ද ආධාරේ
ළබැඳි බිරිඳ දරු මුණුබුරු සෝයුරු හදකම්පිත කඳුළේ
සැඟවී පූජක පැවිදි යැදුම් හඬ මුසුවුණි අල්තාරේ.

# IS AGING ELDERS' MISTAKE?

Some processes are inevitable. Aging is one. For a child aging is observing the change of appearance in their grandparents. For a student aging may be a problem of spelling: whether it is spelt in American way (aging) or British way (ageing). For youth, it is most probably not their problem because they are active, strong, vivacious, energetic, dynamic and what not. Everything seems to be rosy in the youth and most don't pay any heed to the problem of aging. Nevertheless, once people reach their late fifties, joints begin to ache, experience unexpected physical exhaustion and all of a sudden they feel they are aging.

The hesitation to accept that you are growing old and unpreparedness are two major reasons for a fair number of problems, the aged undergo at present. Admitting that a person is growing old will do many good things for a person. One will change one's life style. One can't work and overwork like a youth. When the signs signal and symptoms appear, seeking medical advice is a sine qua non. Preparedness for old age is also essential. Elders should begin settling their worldly affairs and should not carry unnecessary burdens and responsibilities in their minds. This will definitely help elders maintain peace of mind that would lead to better health. It is said most of our diseases are psychosomatic. Mental worries cause complications in the body and vice versa.

When people grow older, they are forced to stop any unhealthy habit. Most people having gastritis suffer from insomnia. Taking alcohol can only worsen the situation. So, in order to get a good sleep, they have to stop taking alcohol. Isn't it true that with a firm decision, any bad habit can be stopped? Many elders suffer and make their dependents' lives sometimes miserable because of their bad habits when they were strong and active. Even though reliable studies have shown that a significant number beverages and processed food are bad for health, the people continue to consume them that could have been skipped. Once the people reach their old age, they realize that the best drink is water and should eat a variety of organic food with fibre and should exercise daily. In this context, "Late will never be better" and aging is elders' mistake.

When aging is looked at from moral perspective, much criticism is leveled at children. The society finds fault with children who send old parents to Homes for elders, who don't look after the aged and neglect their needs. This is a matter of children's bringing up and upbringing. A careful study will show the parents who have sacrificed so much to give best education to children are

neglected by their children in the old age. As a consequence, there are many issues regarding this so called “best education” in the country. The Sri Lankan government has freed itself from free education and allowed anyone, every Dick and Tom to establish an educational institute or an international school with one national. The value education has been given minimal attention. However, it is still encouraging to see how poor children with a little academic education and more value education look after their parents so lovingly.

If it were not for the work of God’s angels on earth, the tragedy of elders today would have been worse. There are so many Catholic nuns who have sacrificed themselves to look after the aged in the country. Most elders in these homes are frustrated, seriously ill and suffer from dementia. So looking after them is never an easy task. These nuns’ mission is simply great and only a few seem to know them and appreciate their work. It should also be noted and admired the Catholic priests who sacrifice themselves to look after senior priests who gave their total life to work in God’s vineyard.

Believe and never lose faith! God works through priests, nuns and devoted laity. The elders who trust in divine providence will never be abandoned by God. The Holy Bible says, “Look at the birds of the air; they neither sow nor reap nor gather into barns, and yet your heavenly Father feeds them. Are you not of more value than they?” (Matthew 6:26) And both the young and the old should also take to heart that they will be responsible in the presence of God for the lifestyle they spend. Finally, another important question remains how the remaining days in the old age should be spent. Thank God for every new day, be content with what you have and be proud of your past work and people whom you met. Never think and regret of a different or better life you might have had.

**K. C. Grero**

Senior Lecturer, Former Oblate Scholastic

## තවත් යන්නට දුර තියේවි ද ?

තවත් යන්නට දුර තියේවි ද
සොඳුරියේ මේ මාවතේ
නැවතුමක් ළඟ ඔයත් ඉන්නකො
මේ ගමන් මග කෙළවරේ

සදා දරු කැල බලා සුරතල්
ළයේ සොම්නස රසය වින්දා
දීග කන්නට ගියා පිටවී
එවුන්ගේ සුර ලොව සොයා

නුඹත් නැතිනම් මමත් එකතැන
සරණ වන්නට නැහැ කෙනෙක්
මගේ පණ බිඳ ඇදෙන මොහොතේ
යන්න එනව ද තනි නොවී

ශාන්ත රණතුංග

# ඕං එහෙනං



| | |
|---|---|
| හැට පැන්නත් හොට බිම ඇණ නොගත්ත කෝපි කාලේ | ජ්‍යේෂ්ඨයෝ |
| ලෝකයේ වෙනසක් ඇති කරලන්නට දිවිය ම කැප කළ | ජ්‍යේෂ්ඨයෝ |
| එසේ නො වන්නට අප වනාන්තරයේ බව කී අපගේ | ජ්‍යේෂ්ඨයෝ |
| පින් දෙමු පුද දෙමු ආසිරි පතනෙමු ආදර අපගේ | ජ්‍යේෂ්ඨයෝ |
| | |
| දිවි ගමනේ දුරු කතර ගෙවන්නට මං පෙත් ඉදි කළ | ජ්‍යේෂ්ඨයෝ |
| ගුණ නුවණින් සිත් සතර කියා දුන් දෙවිවරු වන් අප | ජ්‍යේෂ්ඨයෝ |
| ලෙඩේ දී දුකේ දී සැනසිලි දෙන්නට දරදිය ඇද්දෝ | ජ්‍යේෂ්ඨයෝ |
| අමතක කළොතින් වැඩ වරදින බව ලෝකෙට පෙන්නූ | ජ්‍යේෂ්ඨයෝ |
| | |
| දැනුමින් පිරිපුන් දැනුම් ගොඩක් ඇති ඇවිදින පොත්ගුල් | ජ්‍යේෂ්ඨයෝ |
| අපිත් කියවගමු ලොව සැමට ම දෙමු දැනමුතුකම් ඇති | ජ්‍යේෂ්ඨයෝ |
| ගත පණ නැති මුත් ඇස් පිය වන තෙක් හිතේ හයිය ඇති | ජ්‍යේෂ්ඨයෝ |
| ඉවතට නොදමමු නිති වඩවාගමු ඇස් වගෙ අපගේ | ජ්‍යේෂ්ඨයෝ |
| | |
| නාකිය, නොහැකි ය යයි කියමින් සමච්චල් කරනා අපගේ | ඇත්තෝ |
| නාකි විසේ ගෙයටත් වැඩි උස යයි කට මැත දොඩවන අපෙ | ඇත්තෝ |
| වයසට යනකන් වැඩපොළ අරගෙන මඩමට දක්කන අපෙ | ඇත්තෝ |
| මහලු මඩම්වල ඉඩ නැති වෙන්නට වැඩකිඩ දානා අපෙ | ඇත්තෝ |
| | |
| කොන්ද නමා ගෙන හැරමිටි ගාගෙන සින්දු කියනවා අපෙ | ඇත්තෝ |
| සීයා මනමාලයා නාකි ඉලන්දාරියා කියමින් නට නට ඉන්නා අපෙ | ඇත්තෝ |
| ආච්චි සීයලා නැතිනම් මුනුබුරෝ අයාලේ යන එක නම් | සත්තෝ |
| එවන් ලෝකයක වැඩිහිටි දැකුමට පොඩිහිටියෙක් විය | යුත්තෝ |
| | |
| දෙටු පෙළ රැකුණොත් පසු පෙළ ඉබේ ම රැකෙනා බව නම් | සිකුරු යි |
| එය සිහියට ගෙන කටයුතු කිරීම මනුලොව දෙව්ලොව ජය | සිකුරු යි |
| ගිය දේ ගියාවේ වෙමු පසුතැවිල්ල කමාව සැමදා ගත | යුතු ම යි |
| පොඩිහිටියන් ලෙස වැඩිහිටි සුරැකුම සැමදා සැමවිට කළ | යුතු ම යි |


නේසන් ඔයස් - සූරිය

## කුඩා පයාගල පරලෝක රාජේශ්වරියගේ දෙව් මැදුරේ 150 වෙනි ජුබිලිය නිමිත්තෙනි

හාර පන්සීයක් වසර
දේවස්ථාන කතාවක
මුතුන් මිත්තන් කියන්නෙම
ඉතිහාසයේ අයිතිකරුවන් ය


අසීරුම අමාරුම කොටස කර
නික්ම ගිය විරුවන්ට
කවද හරි දවසක
නුඹලාවත් එකතු වනු ඇත
කවද හරි දවසක
ඒ ශ්‍රේෂ්ඨයින් අතරට
නුඹලගේ නම් ද තිබෙනු ඇත

නිසලව නිහඬව
ඔවුන් විය නිමකර ඇත
ශ්‍රේෂ්ඨයෝ නම් එසේය
උදම් අනන්නේ නැත
අනාගතයේ දවසක
එසේ ලියවෙනු ඇත...




චමත් බී. පයාගල
කටුකුරුන්ද කළුතර

## අමිතගේ හද ගැස්ම ........



# පුංචි විකුම්

## ළමා ප්‍රබෝධනය



"පිදිය යුත්තන් පුදමු සෙනෙහෙ සිතින්."

පිදිය යුත්තන් පිදීම උතුම් මංගල කාරණයක් බව බුදු දහමේ සඳහන් වෙනවා. කවුද මේ පිදිය යුත්තන් පුංචි ඔබ හිතනවා ඇති. දුවේ, පුතේ මේ ලෝකය ලස්සන කරන්න, යහපත් තැනක් කරන්න වැඩ කරන, වෙහෙස වෙන හැමෝම පිදිය යුත්තන්. ඒ වගේ ම මේ ලෝකය ආදරයෙන්, කරුණාවෙන්, සාමයෙන් පුරවන අය පිදිය යුත්තන්. ඒ අතරත් පුංචි දරුවන්ව ආදරෙන් රැක බලා ගන්නා අය හරි ම විශේෂයි. මොක ද එයාල තමයි මේ ලෝකයේ යහපැවැත්මට අවශ්‍ය අනාගත පරපුර ගොඩනගන අය.

මතක් කරල බලන්න ඒ කවුද කියලා... අපේ අම්මල, තාත්තල, වැඩිහිටියො, ගුරුවරු සිහිපත් වෙනවා නේ ද? ඒ අය අපි වෙනුවෙන් කළ දේවලට පෙරළා අපට කෘතගුණ සලකන්න පුළුවන් විදි ගොඩක් තියෙනවා. අපට පුළුවන් එයාලගෙ හිත් සතුටු වෙන විදියට අපේ ජීවිත ගොඩනගා ගන්න. ඒ වගේ ම එයාලට ආදරය දෙන්න. කරුණාවන්ත වෙන්න. එයාලගෙ ජීවිතවල අමාරු තැන්වල දී සහය වෙන්න.

ඔන්න, තරු නැන්දගෙ යාළුවෙකුගෙ දුවෙක් ඉන්නවා. එයා මේ සැරේ සාමාන්‍ය පෙළ පාස් වුණා ඒ නමයක් ම අරගෙන. දුවගෙ ආච්චි සැහෙන කාලෙක ඉඳල අසනීපෙන් ඉන්නෙ. මේ දුව ආච්චිට වෙලාවට කෑම ටික දෙනවා. බෙහෙත් දෙනවා. ආච්චිව සෝදනවා. පිරිසිදුව තියනවා. දුවගෙ අම්මා කියනවා "මට හරිම පුදුමයි අපේ දුව ගැන. එයා ආච්චිගෙ කැත කුණු වුණත් අස්කරනවා කිසි ගාණක් නැතුව. ආච්චි ගැන නිතර ම හොයල බලනවා" කියල. ඉතින් එහෙම ආච්චිවත් බලාගෙන ඉස්කෝලෙ වැඩත් හොඳට කරගත්තු අපූරු දුවක් ඈ. ඇය පුංචි වීරවරියක් නේ ද?

ඒ වගේ ම ළඟ දී දවසක සමාජ මාධ්‍යවල දොදොල් විකුණන අට වසරේ පුංචි පුතෙකු ගැන තොරතුරු පළ වුණා. එයාගෙ අම්මා, තාත්තා දාල ගිහින්. ආච්චි ළඟ තමයි හැදෙන්නෙ. මේ පුතා ඉස්කෝලෙ ගිහින් ඇවිත් හවසට ආච්චි හදල දුන්නු දොදොල් විකුණනවා. ඒ පුතා ආච්චිට කොයිතරම් හයියක් ද?

මහවිලච්චිය පැත්තෙ ඇතුළේ ගමක වැඩකට ගිය වෙලාවක තරු නැන්දට හමුවුණා ඉස්කෝලෙ යන වයසෙ දරුවො ටිකක්. එයාලගෙ හවස් වරුව ගතවෙන්නෙ අම්මල, තාත්තලගෙ වගා වැඩට උදව් වෙන්න. හැන්දෑ වෙද්දි එළුවො රංචු, හරක් රංචු වැවට ගෙනිහින් වතුර පොවාගෙන ආපහු ගාල් කරන්නෙත් එයාල. ඒ පුංචි දරුවො දෙමව්පියන්ට කොයිතරම් හයියක් ද? ඒ තමයි අද කාලෙ පුංචි වීරයො.


ඔන්න, මෑතක ලස්සන යොවුන් නවකතාවක දොරට වැඩුමට සහභාගි වෙන්න ලැබුණා. ඒ පොත ලියල තිබුණෙ අවුරුදු අසූවක සීයා කෙනෙක්. විශ්‍රාම ලැබූ ගුරුවරයෙක්. හැරමිටි වාරුවෙන් අමාරුවෙන් උත්සවයට ආව වුණත් සීයා ලස්සන කතාවක් කළා. එදා ඒ උත්සවය සංවිධානය කරල තිබුණෙ අවුරුදු හතළිහකට කලින් ඒ ගුරුතුමා උගන්වපු ඉස්කෝලෙ දරු පිරිසක්. එදා ඉස්කෝලෙ විශ්‍රාමික ගුරුවරුයි, ඒ කාලෙ දරුවො වුණු අද අම්මල, තාත්තල වෙන ගෝලයොයි ගොඩක් ඇවිත් හිටියා. ඔයාලට හිතාගන්න පුළුවන් නේ ද, ඒ ගුරුතුමන්ලාට දැනුණු සතුට...? මට එදා ඒ වැඩිහිටි ගෝලයන්වත් පෙනුණෙ තාමත් ඉස්කෝලෙ යන පුංචි දරුවො ටිකක් වගේ.

ඉතින් දුවේ පුතේ, නිසි තැන නිසි අයට ගරු බුහුමන් දක්වන්න, ආදරය දක්වන්න, කරුණාවන්ත වෙන්න ඒ සංවේදී බව, අවබෝධය අපේ පුංචි වීරයන්ට වැඩි වැඩියෙන් ලැබේවා...



තරු නැන්දා

## ප්‍රහේලිකා අංක - 87




### හරහට

1. උපකාරය, උදව්ව
2. "වැඩිහිටි" යන්නට සමාන අරුත් දේ.
4. විවීමට භාවිතා කරයි.
5. මැණික් සහ සීනුව යන්නට සමාන අරුත් දේ.
6. ශු. පවුලේ මූලිකයා
9. සංදේශ කාව්‍යයකි.
11. අප දෙවියන්ගෙන් බලාපොරොත්තු වන දේ.
12. හිස
13. කියමන්
14. දකුණු යුරෝපයේ, මධ්‍යධරණී මුහුදේ පිහිටි දූපතකි.
15. පමණට වඩා බැඳුණු
16. සොරකම් කරන ලද දෙය, වංචාවෙන් ගත් දෙය
18. ගොවිතැනට ජලය සැපයෙන ප්‍රධාන මාර්ගයක්.
20. නුවර
22. කරන සේවයට ලැබෙන මුදල
23. කතාව, කතන්දරය
26. ස්වල්පය
28. පොළොව
29. සිංහල ක්‍රමයට දෙවන මාසය.

### පහළට

1. කතෝලික ධර්මයේ ජ්‍යෝෂ්ඨ ශුද්ධවන්ත යුවළක්
2. චාලට් බ්‍රොන්ටේ විසින් ලියන ලද "ජේන් අයර්" නව කතාවේ ප්‍රධාන චරිතය
3. ජ්‍යෝෂ්ඨ යන්නෙහි විරුද්ධ පදය
4. ප්‍රමාද
7. ආහාර රසවත් කිරීමේ දී භාවිතා වන ශාක වර්ගයකි.
8. "රන්මුදු ඇල්ල" දිය ඇල්ල පිහිටියේ
9. මිදුල
10. "උප" හෝ "දෙවැනි" යන අරුත් දේ.
12. කැනඩාවේ අගනුවර
13. මාර්ගය
15. රවුම
17. සතුරු බල සේනාව
18. සමාජයේ ජ්‍යෝෂ්ඨයන් මෙම කොටසට අයත් වේ.
19. ජ්‍යෝෂ්ඨ පුද්ගලයන් සිය වයසත් සමඟ මෙමඟින් පිරිපුන් වේ.
21. කමතේ දී වී හුළං කරන කුල්ල මේ නමින් හැඳින් වේ.
23. පවත්නා දවස
24. රතු හා තද නිල් මිශ්‍ර වර්ණය
25. නිරයේ පාලකයා
27. ශබ්දය ඇසීමට උපකාරී වන ශරීරාවයවය.

**ගරු චාමික සුදර්ශන නිමනි පියතුමා,**
මැසනඩ් ඉංග්‍රීසි අධ්‍යාපන ආයතනය,
කටුවපිටිය, මීගමුව.

ප්‍රහේලිකාව සඳහා ඔබගේ පිළිතුරු තැපැල්පතක පමණක් අලවා පහත ලිපිනයට, **2025 සැප්තැම්බර් 30** ට පෙර තැපැල් කරන්න. ජයග්‍රාහකයන් අතුරින් කුසපත් ඇද තෝරා ගත් **තිදෙනකුට මුදලින් තෑගි පිළිවෙළින්, රු.2000.00, රු.1500.00, රු.1000.00** බැගින් පිරිනැමේ. ***විශේෂ මතක් කිරීමක් - ප්‍රහේලිකාවේ විසඳුම් එවන විට ඔබේ නම, පන්තිය, පාසල, පාසලේ සහ නිවසේ ලිපිනය සඳහන් කර එවන්න.***

**ප්‍රහේලිකා අංක - 87**
**"ළමා භක්ති ප්‍රබෝධනය", අංක 265, ඩීන්ස් පාර,**
**මරදාන, කොළඹ 10.**

## ප්‍රහේලිකා අංක 85 - පිළිතුරු

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 දේ | ව | මැ | ණි | 2 යෝ | | 3 පා | රා | න් | 4 ධ |
| ශ | | | | ග | | ත්‍ර | | | නු |
| 5 න | 6 මෝ | ම | 7 රි | ය | 8 නි | | 9 බි | හා | ර් |
| 10 ය | ස | | කි | | 11 ජ | ග | ත් | | ධ |
| | ම | | ල් | | බි | | 12 ති | 13 මී | ර |
| 14 මැ | | 15 බ | ල | ධ | ම | 16 නි | | ය | |
| ශි | | | ග | | | 17 ක | ව | න් | 18 ධ |
| | 19 ස | ක | ස් | 20 ක | ඩ | | | 21 මා | නා |
| 22 ම | | | 23 ක | ට | | 24 ට | 25 ය | ර | ය |
| 26 ව | ක් | ක | ඩ | | | | 27 ස | ය | න |

## ආදරණීය දරුවනි,

"ළමා ප්‍රබෝධනය" ට
ඔබගේ ලස්සණ නිර්මාණ,
කවි, ගීත, නිසඳැස්,
කෙටිකතා, ලිපි ආදිය ලැබීමට
අපි බොහොම කැමැත්තෙන් සිටිමු.
ඔබ එවන ඒ නිර්මාණය සමඟ
පන්තිභාර ගුරුතුමාගේ හෝ
ගුරුතුමියගේ
අත්සන ඇතිව අප වෙත එවන්න.

**සංස්කාරක පියතුමා,**
**"භක්ති ප්‍රබෝධනය",**
**265, ඕීන්ස් පාර, මරදාන,**
**කොළඹ 10.**
Email: bhakthi.prabodhanaya@gmail.com

## ප්‍රහේලිකා අංක 85 ජයග්‍රාහකයෝ

දයාබර දරු දැරියනි,

ප්‍රහේලිකා අංක 85 සම්පූර්ණ කර අප වෙත එවූ සැමට ම ස්තුති කරමු. නිවැරදි පිළිතුරු එවූ දරු දැරියන් අතුරින් පහත නම් සඳහන් දරුවෝ ජයග්‍රහණය කළහ. සහභාගී වූ සියල්ලන්ට ම සුබ පතන අතර ත්‍යාගලාභීන් වෙත ත්‍යාග යථා කාලයේ දී නිවෙස් වෙත ලැබෙන්නට සලස්වන බව කරුණාවෙන් සලකන්න.

**නිවැරදි පිළිතුර එවා ජයග්‍රහණය කළ දරුවෝ**

- **පළමු ස්ථානය** - ශශේන් පෙරම්, 9 ශ්‍රේණිය, ද මැසිනොද් විදුහල, කඳාන.
- **දෙවන ස්ථානය** - විහග රන්දෙව්, 8 ශ්‍රේණිය, ලොයොලා විදුහල, බෝපිටිය.
- **තෙවන ස්ථානය** - සවීන් හසරැල්, 8 ශ්‍රේණිය, OKI ජාත්‍යන්තර පාසැල, කඳාන.

## භක්ති ප්‍රබෝධනය ඉදිරි තේමා

**2025 නොවැම්බර් / දෙසැම්බර් - "ජීවිත සුරකින සාමය ද? ජීවිත නසන යුද්ධය ද?"**
(නොවැම්බර් - දෙසැම්බර් කලාපය සඳහා ඔබ එවන ලිපි සැප්තැම්බර් 15ට පෙර අප වෙත එවන්න.)

**2026 ජනවාරි / පෙබරවාරි - "මත් රසින් මත් වී"**
(2026 ජනවාරි - පෙබරවාරි කලාපය සඳහා ඔබ එවන ලිපි නොවැම්බර් 15ට පෙර අප වෙත එවන්න.)

# කතෝලික ධර්මය
## ආදර්ශ ප්‍රශ්න පත්‍රය - II වන කොටස
## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2025

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

**1.** 1. ජේසුස් වහන්සේගේ කර පිට තැබූ කුරුසය උසුලාගෙන යාමට සහය වූයේ කවුද?
2. "මාගේ ස්වාමිනී, මාගේ දෙවියනී" යන විශ්වාසය ප්‍රබල ලෙස ප්‍රකාශ කරන ලද වගන්තිය කියන ලද්දේ කවුරුන් විසින් ද?
3. ශුද්ධවූ සභාවේ පළමු ප්‍රාණපරිත්‍යාගිවරයා කවුද?
4. පේදුරු තුමාගේ මහා ප්‍රකාශය ලියන්න.
5. "අපෝස්තුලුවරයා" යන්නෙහි තේරුම ලියන්න.
6. 7 වන බුවනෙකබාහු රජතුමාගේ ඉල්ලීම පරිදි 1543 දී ලංකාවට පැමිණි පළමු ධර්මදූත කණ්ඩායම නම් කරන්න.
7. මැවීම පිළිබඳ දෙවන කථාව කුමන සම්ප්‍රදාය මත පදනම් වූයේ ද?
8. දෙවියන් වහන්සේ ආබ්‍රහම් සමග ඇති කර ගත් ගිවිසුමේ ඇතුළත් ප්‍රධාන කරුණු දෙක නම් කරන්න.
9. ඉශ්‍රායෙල් ජනතාව සීනයි ගිවිසුම මගින් දේව ජනතාව වූවා සේ ම අප දේව දරුවන් වූයේ කුමන ප්‍රසාද නිධානය මගින් ද?
10. ස්නාවක ජුවාම් තුමා තම දූත කාර්යය ඇරඹුවේ කොහෙන් ද?

**2.** 1. ප්‍රාතිහාර්යය ප්‍රධාන වශයෙන් කොටස් කීයකට බෙදේ ද?
2. ප්‍රාතිහාර්යය වර්ග 3 ක් නම් කරන්න.
3. ජේසුස් වහන්සේ සිදු කළ ප්‍රාතිහාර්යය තුළින් අපට දැන ගත හැක්කේ මොනවා ද?

**3.** 1. ස්නාවක ජුවාම් තුමා සාමාන්‍ය ජනතාවට දුන් උපදෙස් මොනවා ද?
2. ස්නාවක ජුවාම් තුමා දේශනා කළ පාර්ශ්වයන් 3ක් නම් කරන්න.
3. ස්නාවක ජුවාම් තුමා ඉදිරිපත් කළ නව සමාජ ධර්මතා තුළ ගැබ්ව ඇති කරුණු 5ක් ලියන්න.

**4.** 1. 1948 දී ශ්‍රී ලංකාවට නිදහස ලැබීමෙන් පසු කතෝලික සභාව මුහුණ දුන් ප්‍රධාන ගැටලුව කුමක් ද?
2. 1961 දී පාසල් රජයට පවරා ගැනීම නිසා මුහුණ දුන් ප්‍රධාන ගැටලු 3ක් ලියන්න.
3. නිදහසින් පසු යුගය තුළ කතෝලික දහමේ ව්‍යාප්තිය සඳහා ඇති කළ වෙනස්කම් මොනවා ද?

**5.** 1. 1687 දී ලක්දිව කතෝලිකයන් ලන්දේසි පීඩනයෙන් මුදා ගැනීමට දෙවියන් වහන්සේ විසින් එවන ලද ගැලවුම්කරු කවුද?
2. ශුද්ධවූ ජුසේවාස් මුනිතුමා සිදු කළ ප්‍රාතිහාර්ය 3ක් ලියන්න.
3. ලන්දේසීන් මුහුදුබඩ පාලනය කළ අවධියේ එම ප්‍රදේශයේ ජීවත් වූ කතෝලිකයන්ට එල්ල වූ බාධා 5ක් ලියන්න.

## පිළිතුරු

**1.** 1. සිරේනියේ සීමොන් ය. 2. තෝමස් තුමන් විසින් 3. ශුද්ධවූ ස්තේපන් තුමා
4. "ඔබ ක්‍රිස්තුවරයාණෝ ය. ජීවමාන දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝ ය."
5. යවනු ලැබූ තැනැත්තා 6. ප්‍රැන්සිස්කාන ධර්මදූතවරු පස් දෙනෙක්
7. යාවේ සම්ප්‍රදාය 8. අසංඛ්‍ය දරු පරපුරක් බිහි කිරීම / සදහට හිමිවන දේශයක් ලබා දීම.
9. ප්‍රසාද ස්නාපනය මඟින් 10. ජොර්දාන් නදිය අවටින්

**2.** 1. හතරකට
2. රෝගීන් සුව කිරීම / දුෂ්ට ආත්ම දුරු කිරීම / ස්වභාව ධර්මය සම්බන්ධ ප්‍රාතිහාර්යය / මළවුන් නැගිටවීම හා සම්බන්ධ ප්‍රාතිහාර්යය
3. දේව මහිමය හා බලය / මෙසියානික රාජ්‍යයේ ලකුණු / ජේසුස් වහන්සේගේ දේව පුත්‍ර භාවය / දෙවියන් වහන්සේ මිනිසාට දක්වන අසීමිත ප්‍රේමය / ජේසුස් වහන්සේගේ මෙසියානු ධර්මදූත මෙහෙවර

**3.** 1. අඳන දෙකක් ඇති අය නැති අයට දෙත්වා / කෑම ඇති අය කෑම නැති අයට දෙත්වා
2. සාමාන්‍ය ජනතාව / අයකැමියන් / සෙබළුන්
3. යුක්තිය / සාධාරණත්වය / සාමූහිකත්වය / සහජීවනය / ප්‍රේමය / දයාව

**4.** 1. 1961 දී පාසල් රජයට පවරා ගැනීම.
2. පාසල් අධ්‍යාපනය තුළ තිබූ ආගමික පරිසරය අහිමි වීම / ආගම ඉගැන්වීම සතියකට කාලච්ඡේද 2 කට සීමා වීම / කතෝලික පාසල් පරිපාලනය, ගුරුවරුන් බඳවා ගැනීම, මාරු කිරීම ආදිය පිළිබඳ වගකීම හා බලතල රජය සතු වීම.
3. නිදහසින් පසු දේශීය අගරදගුරුවරුන් හා රදගුරුවරුන් පත් කිරීම / දීපව්‍යාප්ත දහම් පාසල් ක්‍රමයක් මෙන් ම ධර්මෝපදේශන මධ්‍යස්ථාන බිහි වීම / ශ්‍රී ලාංකීය කතෝලික සභාව දේශීයකරණයට යොමු වීම / 2012 වන විට රදගුරු වසම් 12 කට බෙදීම.


**5.** 1. ශුද්ධවූ ජුසේවාස් මුනිතුමා
2. දැඩි නියඟයක දී මහනුවර රාජධානියට වැස්ස ලබා දීම / දැදුරු ඔයෙන් පා ගමනින් එතෙර වීම / තනි අලියෙකු මෙල්ල කිරීම.
3. සියලු කතෝලික පියවරුන් රටින් පිටුවහල් කිරීම / දිව්‍ය පූජාව පැවැත්වීම තහනම් කිරීම / කතෝලික පාසල් හා පුණ්‍ය ආයතන රෙපරමාදු පූජකයන්ට පවරා දීම හා සමහර ආයතන විනාශ කිරීම / සියලු ම පාසල්වල රෙපරමාදු දහම පමණක් ඉගැන්වීම / පාසල්වලට දරුවන් නො එවන දෙමාපියන්ට දඬුවම් කිරීම / රෙපරමාදු දේවස්ථානවල සිදු නො කරන විවාහ හා බෞතිස්ම පිළි නොගැනීම.

**ජේ. ඒ. එල්. එම්. ශ්‍රීමතී සිල්වා මෙනවිය.**
විදුහල්පතිනිය - මිනු / පහළ මඩම්පැල්ල කනිෂ්ඨ විද්‍යාලය - කටාන.

# නව ගිවිසුම හා සුබාරංචි ලේඛන ගතවීම XI

## අ.පො.ස. (උ.පෙළ) ක්‍රිස්තියානි ධර්මය/ශිෂ්ටාචාරය සඳහා අත්වැලක්

## අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොත I



පසුගිය ලිපි ආශ්‍රයෙන් ඔබ හා සාකච්ඡා කරන ලද්දේ ක්‍රිස්තියානි ශුද්ධ ලියවිලි සම්බන්ධව ය. මෙම ලිපියෙන් බලාපොරොත්තු වන්නේ ක්‍රිස්තු ශාසනය ආරම්භක අවධියේ සිදු වූ කරුණු කාරණා ය. ඒවා අන්තර්ගත වන්නේ අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොතේ ය.

<u>හැඳින්වීම</u>

ක්‍රිස්තුස් වහන්සේගේ ස්වර්ගාරෝහණයෙන් පසුව ගොඩ නැගුණ මුල් අපෝස්තලික සභාවේ ශ්‍රාවකයන් හට ක්‍රිස්තුස් වහන්සේ පැවරූ දූත මෙහෙවර කෙසේ ද? එය ඉටු කරන ලද්දේ කෙසේ ද? යන්න මෙම ලිපියෙන් පැහැදිලි කෙරේ. මෙම පොතේ වැදගත් පණිවුඩය වන්නේ දෙවියන් වහන්සේ මුල් කිතුනුවන් සමග අභිරහස්මය වැඩ සිටීම යි. මුල් කිතුනු සභාවට එල්ල වූ අභියෝග බොහෝ ය. එම අභියෝග සඳහා නිර්භීතව මුහුණ දෙමින් ක්‍රිස්තු ශාසනය බලගැන්වූ අයුරු අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොතෙන් පෙන්වා දේ.

<u>කර්තෘත්වය හා සම්පාදිත කාලය</u>

ලූක් ශුභාරංචියේ දෙවන කාණ්ඩය ලෙස අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොත හඳුන්වා දිය හැක. කර්තෘත්වය සම්බන්ධව සභා පියවරුන් වන ඉරනේයිස් තුමා, ඇලෙක්සැන්ඩ්‍රියාවේ ක්ලෙමන්ට් තුමා, ටර්ටූලියන්, ඔරිජින්, එව්සේබියස් තුමන්ලා පෙන්වා දෙන්නේ ශු. ලූක් තුමා එම පොත රචනා කළ බව ය. ලූක් තුමා අන්තියෝකියේ සිට පැමිණි සිරියානු ජාතිකයෙකි. ඔහු ජුදා ජාතිකයෙකු ලෙස පිළිගැනීමක් නැත. එතුමා දේශීය වෛද්‍යවරයෙකි. ශුද්ධවූ පාවුලු තුමාගේ සහකරුවා ලෙස ද කටයුතු කර ඇත. (ක්‍රියා 16:10)

එම ග්‍රන්ථය රචනා වූ කාලය ලෙස විශාරද මතයක් වන්නේ ක්‍රි.ව. 63-70 දී පමණ බව ය. එම කාලය ක්‍රිස්තු ශාසනයට රෝම අධිරාජ්‍යා වූ නීරෝ විසින් පීඩා කළ සමයකි. එසේම නීරෝ විසින් පාවුලු තුමන්ව හා පේදුරු තුමන්ව විනිශ්චය සඳහා රෝමයට කැඳවන ලද්දේ ද එම යුගයේ ය. පාවුලු තුමන්ව ප්‍රාණ පරිත්‍යාගවරයෙකු ලෙස මරා දැමීම, ජුදා රෝම කැරැල්ල, රෝමවරුන් ජෙරුසලම විනාශ කිරීම යන කාරණා කිසිවක් මෙම පොතේ ඇතුළත් නොවේ.

<u>ශුද්ධාත්ම පොරොන්දුව</u>

අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොත මූලිකව ම පෙන්වා දෙන්නේ ශුද්ධාත්ම දානයෙන් අපෝස්තුලුවරු පෝෂණය වූවායින් පසුව එම පිරිස

ශුභාරංචිය දේශනා කිරීමට ලොව පුරා සැරිසැරූ ආකාරය යි. එය ධර්මදූත සේවය ලෙස නම් කරයි. ක්‍රිස්තියානි සභාව ආරම්භ වූයේ ජුදයාවේ ජෙරුසලම් නගරයෙනි. ජුදයාවට පමණක් සීමා වූ එම ව්‍යාපාරය ලොව පුරා පැතිරීමට හේතුව වූයේ ස්තේපන් තුමාගේ මරණය යි. (ක්‍රියා 7:54) එම සිදුවීමෙන් පසුව අපෝස්තුලුවරු විවිධ ප්‍රදේශවලට ගොස් සැඟවී ධර්මය ප්‍රචාරය කළහ. ඉන් පසුව පාවුලු තුමාගේ ධර්මදූත ගමන්, ජෙරුසලම් මන්ත්‍රණ සභාව, රෝමානු අධිරාජ්‍යයාගේ පීඩන ඇරඹීම මෙම පොතෙන් පෙන්වා දිය හැකි ය. අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොත අවසාන වන්නේ පාවුලු තුමන් රෝමයේ සිට දෙවියන් වහන්සේගේ රාජ්‍යය ගැන ප්‍රකාශ කිරීම ය.

<u>ක්‍රියා පොතේ ස්වභාවය</u>

මෙම ග්‍රන්ථයේ අන්තර්ගතය ගැන විමසීමේ දී පහත සඳහන් කරුණු විශේෂ වේ.

1. දේශනා
2. සාරංශ ගත කිරීම
3. නාට්‍යමය ස්වරූපයෙන් ඉදිරිපත් කිරීම
4. භාෂා ශෛලිය හා ව්‍යවහාරය

- **දේශනා**

දේශනා අතර ප්‍රධාන දේශනා 3කි.

1. පේදුරු තුමාගේ දේශනය
2. පාවුලු තුමන් විසින් පවත්වන ලද දේශන
3. ස්තේපන් තුමාගේ දේශන

මෙහි දී සෑම සිදුවීමක්ම පිළිතුරු දීමක්, චෝදනා හා යෝජනා ඇත්නම් ඒවා විමසීම, වැරදි අවබෝධ නිවැරදි කිරීම, ක්‍රිස්තුස් වහන්සේගේ දූත මෙහෙවර ගැලවීමේ සැලැස්ම පෙන්වා දීම දේශනාවලින් බලාපොරොත්තු වේ. මෙහි දී ප්‍රධාන වන්නේ ශුභාරංචිය පිළිබඳව වැඩිදුර කරුණු පහදා දීම ය.

- **සාරාංශ ගත කිරීම**

මුළු ක්‍රියා පොත ම සාරාංශයක් ලෙස පෙන්වා දෙන්නේ නම් එහි අරමුණ ධර්මෝපදේශනය වන අතර දෙවියන් වහන්සේ විසින් මුල් අපෝස්තලික සභාව සංරක්ෂණය කරමින් දේව මැදිහත්කමින් රැකගත් බව පෙන්වා දීම යි. ඉන් ඉදිරිපත් කරන පණිවිඩය දේව අනාවරණය යි.

- **නාට්‍යමය ඉදිරිපත් කිරීම**

එම පොතේ බොහෝ කතා පුවත් සඳහා චිත්තරූප මවාගත හැක. දෙපාර්ශවයක් අතර ඇති වන දෙබස තුළින් නාට්‍යමය ස්වරූපයක් දැනේ. එය සඳහා කදිම නිදසුන වන්නේ පාවුලු තුමාගේ සිත හැරීම යි.

- **භාෂා ශෛලිය හා ව්‍යවහාරය**

මෙම පොත රචනා කර ඇත්තේ උසස් ග්‍රීක භාෂාවෙනි. ශුද්ධ ලියැවිල්ලේ සෙප්ටුවාජින්ත පිටපතේ භාෂා ව්‍යවහාරය අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතෙන් ද පෙනේ. එසේ නම් සෙප්ටුවාජින්ත පිටපත හා අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොත භාෂා ශෛලිය අතින් කුළුපගතාවයක් දක්වයි. මෙම භාෂා ශෛලිය ක්‍රි. පූ. 3 වන 4 වන සියවස්වල ග්‍රීක භාෂා ශෛලියේ ආදේශයකි.

<u>ක්‍රියා පොතේ ලක්ෂණ</u>

ජේසුස් වහන්සේගේ ස්වර්ගාරෝහණයෙන් පසුව වසර 30 ක පමණ කාලයක් සභාව තුළ සිදු වූ ශුද්ධාත්ම ක්‍රියාවලිය පාවුලු තුමාගේ සිරගත වීම දක්වා විස්තර මෙම පොතේ ඇතුළත් වේ. ඉන් පෙන්වා දෙන පරිදි ශුභාරංචිය මුල් යුගයේ ව්‍යාප්ත වී ඇත්තේ උතුරු මධ්‍යධරණි ප්‍රදේශ, සිරියාව, අන්තියෝකිය සහ සුළු ආසියාව යන ප්‍රදේශවල ය. මෙම පොත නව ගිවිසුමේ ගැලවීමේ ඉතිහාසය වේ. ක්‍රිස්තුස් වහන්සේගෙන් පසුව එම දූත කාර්යය පැවරුණේ ශ්‍රාවකයන්ට ය. ශ්‍රාවකයන් දූත කටයුතු සිදු කළ අන්දම එම පොතෙන් මනාව පැහැදිලි වේ. ඔවුන්ගේ ජීවිත පරිත්‍යාග හේතුවෙන් ක්‍රිස්තු ශාසනය පෝෂණය වී ඉදිරියට පැමිණීම කිතුනුවන් ලද පන්නරයක් ලෙස සැලකිය හැකි ය.

සටහන : **ශාස්ත්‍රපති එස්. හේමාල් පෙරේරා**

# ගරු එමාඩ් දල්පතාදු නි.ම.නි. පියතුමා විසින් රචිත
## අළුත්ම ග්‍රන්ථය දැන් පිට වී ඇත...

කිතුනු පවුලේ අධ්‍යාත්මය ශක්තිමත් කරවන්නට ඔබ වෙත ගෙන එන


# “පුබුදිත හෙළිදරව්ව”

- ආගම යනු කුමක් ද?
- පල්ලියේ මංගල්‍යය
- ඇදහිල්ලට අභියෝග
- විවාහය හා දික්කසාදය
- අම්මා හා තාත්තා
- සාමයේ උල්පත සමාව දීම යි
- දේව දරුවෝ
- චමත්කාරජනක යෞවනය
- මිහිතලයට පිහිතලය නොතබනු
- විභාගය ඔබට අභාග්‍යයක් ද?
- බේබදුකම උඩ යන නත්තල
- බලාපොරොත්තුවේ වන්දනාකරුවෝ

ඇතුළු ලිපි, දේශනා, ගීත හා ගීතිකා, කවි නිසදැස් අඩංගු
මාතෘකා 52 කින් සහ පිටු 272කින් සමන්විතයි.

**ඔබගේ පොත ප්‍රමාද නොවී ලබා ගන්න !**

මිල
රු. 350/=




- කතෝලික පොත්හල, බොරැල්ල
- අගරදගුරු නිවසේ පුස්තකාලය, බොරැල්ල
- ක්ලැරේෂියන් පොත්හල, වැලිසර (රාගම පාරේ වැලිසර ඩිපෝව ඉදිරිපිට)
- මහ වීදිය දෙව්මැඳුර, මීගමුව
- ශාන්ත පීතර දෙව්මැඳුරේ පොත්හල, මීගමුව
- ආගමික භාණ්ඩ වෙළඳසැල, දුම්රියපොළ පාර, මීගමුව
- දිස්නා පොත්හල, කොන්වන්ට් පාර, වෙන්නප්පුව
- සුදසුන පොත්හල, හලාවත

යන ස්ථානවලින් ලබා ගත හැකි ය.

තැපැල් මගින් ගෙන්වා ගැනීමට නම්,
0718415549 / 0723779365 අමතන්න

travel channel

*it's time to*

# TRAVEL

## & EXPLORE THE WORLD





## DREAM DESTINATIONS

CHINA - SINGAPORE - MALAYSIA - VIETNAM

CRUISE TOURS - JAPAN - THAILAND

**& MANY MORE DESTINATIONS...!**

Contact

Anju
077 553 8395

Isuri
077 736 9691

Scan &
Follow us on


මිල රු.100/=
(සහන මිල)

"භක්ති ප්‍රබෝධනය" සංස්කාරක ගරු එමාඩ් දල්පතාදු නි.ම.නි. පියතුමන් විසින් කොළඹ 10 එස් ඇන්ඩ් එස් ප්‍රින්ටර්ස් මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.
පුවත් පතක් ලෙස තැපැල් හලේ ලියාපදිංචි කර ඇත. DOP/NEWS/02/2025